සාධු දැක්ම

The Excellent View

5

මහා මඞ්ගල සුත්‍රය - The Discourse on Blessings

කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක

මහා මඞ්ගල සූත්‍රය

DISCOURSE ON BLESSINGS

IN

PALI

SINHALA

&

ENGLISH

BY

Kiriwattuduwage Seetha Nandanie Goonetilleke

(Director of Parents Memorial Scholarship Foundation)

011 2 877950

ප්‍රථම මුද්‍රණය - 2018
බුද්ධ වර්ෂ - 2562
(වෙසක් පුර පසළොස්වක නිමිත්තෙනි)

සාධු දැක්ම-The Excellent View ⑤

(මහා මඞ්ගල සූත්‍රය:The Discourse on Blessings ඇසුරෙනි)

දෙවන මුද්‍රණය - 2019 - ඔක්තෝබර්

මෙම පොතෙහි දෙවන මුද්‍රණය, පුරා වසර 89ක් ආයු වළඳා 2018-10-29 දින පරලෝසැපත්, කොළඹ-7 ඩී. එස්. සේනානායක විදුහලේ, කීර්තිමත් විදුහල්පති වරයෙකු වශයෙන් සේවය කළ පරමාදර්ශී, සත්ගුණවත් **එස්. එම්. ඒ. ජේ. ඒ. මායාදුන්නේ මැතිතුමාගේ, ප්‍රථම වර්ෂ පූර්ණ ගුණානුස්මරණ පිංකම වෙනුවෙනි.**

මෙම ධර්ම දානය තුළින් ලැබෙන සියලුම පින් එතුමාට නිර්වාණ සුවය පිණිසම හේතු වේවා! යි බිරිඳ, දරුවන්, සහ ඥාති හිතෛෂීන් ඒකරාශීව ඉතසිතින් ප්‍රර්ථනා කරයි.

මුද්‍රණය - DCR Access Lanka printers
33, Thalawathugoda Road,
Pita kotte,
Kotte.
0777-794676

කර්තෘගේ වෙනත් පොත්

1. මා පිය ගුණ සමර
2. සාධු දැක්ම-The Excellent View ①
3. දරිද්‍රතාව හඹා යයි
4. සුවදායක මාවතක් - A Blissful Path
5. ප්‍රීතිමත් ජීවිතයකට මඟ
6. තුදුස් වසරක සඟන් එළියක්- A Moon Light of 14 years
7. සාධු දැක්ම-The Excellent View ② **කරණීය මෙත්ත සූත්‍රය**
8. සාධු දැක්ම-The Excellent View ③ **රතන සූත්‍රය** ඇසුරෙනි.
9. සාධු දැක්ම-The Excellent View ④ **ජිනපඤ්ජරය** ඇසුරෙනි.
10. සංහිඳියාවට මඟක්

පිදුම

සංසාර භව කතරේ අතරමංව සිටි මා විසින්
රැස්කර ගත්තා වූ පුණ්‍ය බල මහිමයෙන්,
මෙවන් බුද්ධෝත්පාද කාලයක
මිනිස් භවයක් ලැබීම පිණිස
මව් කුස පිළිසිඳ ගත් මොහොතේ සිට
අසීමිත සෙනෙහසකින් යුතුව,
බොදු හැඟුම් මහද තුළ ජනිත කරවමින්,
මෙලොව ඉපදීමට
මා ලද භාග්‍ය සුරක්ෂිත කර දී,
ලේ කිරි කර පොවා මා හදා වඩා
ගුණනැණ බෙලෙන් ද පෝෂණය කළ
දයාබර මෑණියන් වූ විශ්‍රාමලත් විදුහල්පතිනි
ලෝරා හෙට්ටිආරච්චි මැතිනියට
සහ පංචශීල ප්‍රතිපත්තීන් දිවිහිමියෙන් සුරකිමින්
ආදර්ශයෙන්ම යායුතු මග පෙන්වා දී,
නිර්භයව එම නිසි මාවත ඔස්සේ
පා නැඟීමට හැකි පෞරුෂයක්
මහද තුළ වර්ධනය කරමින්,
උපන් බිමට ණය නැති
මිනිස් රත්නයක් ලෙසින්
සමාජයට වැඩදායී සේවාවක්
සාර්ථකව ඉටු කිරීමට හැකි ස්ථාවරයකට
මා ඔසවා තැබූ
දයාබර පියාණන් වූ විශ්‍රාමලත් විදුහල්පති
විජයසේන කිරිවත්තුඩුව මැතිතුමාට
බැතිබර සෙනෙහසින් පිදේ.

To my beloved parents in everlasting gratitude

ස්තුතිය

ත්‍රිලෝගුරු සම්බුදු රජාණන් වහන්සේගේ
ශ්‍රී මුඛයෙන් දේශිත,
අසූහාර දහසක අමිල වූ නිර්මල ධර්මස්කන්ධයෙන්
අල්ප මාත්‍රයක වුවද,ගැබ්ව ඇති ශ්‍රේෂ්ඨත්වය
සහ යථාර්ථවාදී බව, පුහුදුන් සැමගේ ලෞකික මෙන්ම
ලෝකෝත්තර සුවය දක්වා විහිදෙන ආකාරය,
ධර්ම ගරුත්වයට සුළු හෝ පලුද්දක් නොවන අයුරින් එළිදැක්වීම
මාගේ මූලික අරමුණ වූයෙන්,

එම අභිප්‍රාය සාක්ෂාත් කරගැනීමට සහාය දැක්වූ
අති උතුම් මහා සංඝ රත්නයට,

සදහම් ග්‍රන්ථකරණය සඳහා නන් අයුරින් සහාය දැක්වූ
නිමල් ගුණතිලක මහතාට,

අක්ෂර වින්‍යාසය සඳහා තාක්ෂණ සහාය ලබා දෙන
ආචාර්ය සදේව ගුණතිලක පුතණුවන්ට,

සදහම් පිපාසිත ජන සමාජයකට පරිශීලනය සඳහා
ග්‍රන්ථ යොමු කිරීමේදී ඉමහත් දායකත්වයක් ලබාදෙන
ක්‍රිෂාන් ගුණතිලක පුතණුවන්ට, සහ

මෙම ග්‍රන්ථ සම්පාදනය ඉදිරියටම කරගෙනයාම පිණිස,
නිසි ප්‍රතිකාර ලබාදෙමින් මාහට නිරෝගී සුවය ලබාදුන්, **විශේෂඥ** ***වෛද්‍ය***
මහාචාර්ය සමන් බී ගුණතිලක මැතිතුමාට...

පුණ්‍යානුමෝදනා සමගින් කෘතඥතාව පුදකරමි.

කර්තෘගෙන්

"සාධු දැක්ම -The Excellent View" ග්‍රන්ථ පෙළ සම්පාදනය සඳහා මා යොමු වූයේ අධ්‍යාපන මාවතෙහි විවිධ දක්ෂතාවන් පෙන්වමින් අ.පො.ස උසස් පෙළ ඉගෙනුම ලබන දරුවන්ගේත්, වෛද්‍ය, ඉංජිනේරු, කළමනාකරණ, නීති සහ කලා ක්ෂේත්‍රයන්හි විශ්ව විද්‍යාල පළමුවසර අධ්‍යාපනය ලබන බුද්ධිමත් දරුවන්ගේත් හදවත් තුළ තෙරපෙමින් තිබූ දහම් පිපාසය යම් පමණකින් හෝ සංසිඳුවීමේ අරමුණෙනි.

වසර 18 පමණ කාලයක සිට දිවයිනේ සියලුම පළාත් ආවරණය වන පරිද්දෙන් ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලැබූ අධ්‍යාපනයෙහි ඉතා දක්ෂ එහෙත් ආර්ථික අපහසුතා මැද ඉගෙනුම ලබන සිසු දරුවන්ට සාර ධර්ම පරිපෝෂණයක් සමගින් ආර්ථිකමය ශක්තියක් ලබාදීම කාලෝචිත මෙන්ම ප්‍රායෝගික බව අවබෝධ වීමත් සමගම ඒ සඳහා සිසු දරුවන් හමුවේ තිබූ සම්බාධකය භාෂා ගැටලුවක් බවද අවබෝධ විණි. **ශ්‍රී ලංකා කැනඩා ශිෂ්‍යත්ව පදනමේ** ආරම්භක සම්බන්ධීකරණ ලේකම් ධුරයෙන් සහ **මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමේ** අධීක්ෂණය තුළින් ලබාගත් අවබෝධය ඔස්සේම සිසු දරුවන් හමුවේ තිබූ සම්බාධකය ඉවත් කිරීමේ අරමුණෙන්, පාලි භාෂාවෙන් පමණක් මුද්‍රණය වී ඇති සදහම් ග්‍රන්ථයන්හි ඇති ධර්ම ප්‍රබෝධය සදහම් පිපාසිත සමාජයකට උකහාගත හැකි පරිද්දෙන් තිළිණ කිරීම සඳහා ඉංග්‍රීසි සහ සිංහල පරිවර්තනයන් සමගින් මෙම ග්‍රන්ථ පෙළ සම්පාදනය කිරීමට පෙළඹුණි.

මෙම **"සාධු දැක්ම -The Excellent View ⑤ "** ග්‍රන්ථය තුළින් ජීවිතයක භෞතික මෙන්ම අධ්‍යාත්මික වශයෙන් ලද හැකි දියුණුව සරල පියවරකින් අරඹා ක්‍රමානුකූලව නිර්වාණ සම්පත්තිය දක්වාම වර්ධනය කරගත හැකි අයුරු **මහා මඞ්ගල සූත්‍රය අනුසාරයෙන් පාලි, සිංහල, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පැහැදිලි කෙරෙයි.**

Author's Note

The series of books "**සාධු දැක්ම** -The Excellent View" written on Dhamma is specially for the young generations all over the world who are keen on learning Pali Stanzas with the Sinhala and English meaning of them.

This edition **"Saadhu Dekma:The Excellent View -5"** reveals 'the Discourse on Blessings' originally in **Pali** but with **Sinhala** and **English** translations including a General Broad Review.

Not only with the forty five years of teaching Experience but many years of experience as the First Sri Lanka co-ordinating secretary of the SLCSF which offers scholarships for 'A' level students and also being the Director of PMSF that offers scholarships annually for University Undergraduate students those who are academically qualified but economically disadvantaged in Medical, Engineering, Management, Law and Arts faculties, I found the thirst of Dhamma that they want to quench and the problem against it is the Language.

That pathetic situation inspired me to write this series of books mainly to distribute freely among the scholarship recipients and to present to the society to get the best use of Dhamma in the way of this Sansaric journey and finally to achieve the highest goal of ***Blissful Nibbana.***

May the Noble Triple Gem blees you all !!!

Do not believe in anything (simply)

- *Do not believe in anything (simply)because you have heard it.*

- *Do not believe in traditions because they have been handed down for many generations.*

- *Do not believe in anything because it is spoken and rumoured by many.*

- *Do not believe anything simply because it is found written in your religious books.*

- *Do not believe in anything merely on the authority of your teachers and elders.*

- *But after observation and analysis, when you find that anything agrees with reasons and is conducive to the good and benefit of one and all* ***then accept it and live up to it.***

*** * * BUDDHA* * ***

(Anguttara Nikaya, Vol 1,188-193)

පටුන

CONTENTS

1. හැඳින්වීම - Introduction

2. පරිත්ත සුත්ත- Paritta Sutta

3. ස්ථාපනය - The Location of the Discourse

4. පිරිත් සජ්ඣායනා - Chanting Pirith

5. මංගල සූත්‍ර උද්භවය-Origin of the Discourse

6. සතුට යනු කුමක්ද?- What is Happiness?

7. මහාමංගල සූත්‍ර ගාථා-Stanzas of the Discourse

8. විවරණය - Commentary

9. මඞ්ගල කරුණු 38– Highest Blessings of Life

10. සාර්ව දැක්මක් - General Review

11. භවයක සැනසුම - සිංහල කවි

12. පුණ්‍යානුමෝදනාව

← 1→ INTRODUCTION

Mangala Sutta – Discourse on Blessings

This Sutta was preached by the Buddha to explain the achievement of real blessings. The background and the significance of this famous discourse are revealed through the Sutta itself. When the gods wanted to know what constituted a real blessing the Buddha clarified the doubt of them.According to the Buddhist wisdom a blessing is not something given by a divine being or someone else, but a state of well being which arises within oneself. When one lives righteously, maintaining human dignity, it creates a healthy atmosphere not only in the outside society but inside the human minds.

This 'Discourse on Blessing's comes to the 1st Sutta out of the main 3 Discourses. 'Jewel Discourse' and the 'Hymn of Universal love' follow it. As a custom this Sutta which comprises twelve stanzas is recited on auspicious occasions.. But it is not just for recital. The meaning of each and every stanza must be understood and the principles of them have to be put into practice. By practicing the advises given in this Discourse one can have utmost 'blessings'. Through this 'Sutta' we can find moral, ethical and spiritual teachings of the Buddha. Taking them as unique guidance the devotees can practice it in the day today lives and get the best use of blessings.

This Discourse reveals us that the Buddha's teachings are not confined to the philosophical and psychological aspects of the religion but extends to the field of social service and the cultivation of self-discipline. As the words of these stanzas are supposed to be the original words preached by the Buddha the Buddhist devotees have high respect and confidence in them. and recite and preserve the verses as they are.

THE IMPORTANCE OF PARITTA SUTTA

The selected discourses for recital are named as Paritta Suttas. The Pali word ***'Paritta'*** is used as '***Paritrana'*** in Sanskrit and '***Pirith***' in Sinhala. Whatever is the language, principally it means **protection.**

The body usually becomes ill. It cannot be prevented. It's a natural phenomenon. The mind not only makes one sick but also cures. The possibility of getting recovery of an optimistic patient who is confidence and cheerful is greater than the patient who is worried and unhappy. It's proved in some recent research in medicine whatever the physical nature of a patient it related to the psychological condition too.

So, it is certain that listening or reciting of Paritta Sutta with confidence is for protection and relief from evil as well as promoting welfare and well-being. When someone is ill, it would be easier for him to listen to what others recite and be able to focus the mind on the Dhamma: truth of the Sutta. There are occasions, as in the case of illness which weakens the mind, when hetero-suggestion (recited & focused by someone else) has been found to be more effective than auto-suggestions. It is obvious that listening to these Paritta Sutta produces in the intelligent and confident listener a wholesome state which can cure and prevent illness.

There is no better medicine other than truth (Dhamma) for both mental and physical ailing which come out as distress, ill omens, evil planetary influence, dangers and accidents as sufferings and misfortunes in this Sansaric journey.

The Location of Mahamangala Sutta in

TI-PITAKA



←3→ THE LOCATION OF THE SCRIPTURES

(ත්‍රිපිටකය තුළ මහා මඞ්ගල සූත්‍රයේ පිහිටුම)

The Mahaa Mangala Sutta is included in that ancient anthology of the **Paali Canon** called **"A Collection of Discourses"** (Sutta-nipaata). This work contains a great variety of discourses, some upon basic subjects suitable for lay people, while others which have great depth are addressed to those who practice Dhamma all the time. The Sutta-Nipaata is the fifth item of the Minor Collection (Khuddaka-nikaaya) and is divided into five sections. **The Mahaa Mangala Sutta** is the fourth sutta of the second of these, called the Lesser Section. The contents of this sutta also appear in the first item of the Minor Collection, known as the Minor Readings (Khuddaka-paatha), called there simply "Mangala Sutta."

ත්‍රිපිටකය විනය, සූත්‍ර, අභිධර්ම වශයෙන් ප්‍රධාන කොටස් 3 ට වෙන්කර ඇත. එහි සූත්‍ර පිටකය නිකාය 5 කට බෙදා ඇති අතර එහි 5 වැන්න ඛුද්දක නිකාය යි. ඛුද්දක නිකාය ග්‍රන්ථ 15 කින් සමන්විත වන අතර එහි 5 වැන්න සුත්ත නිපාතය යි. එම සුත්ත නිපාතය වග්ග 5 කට බෙදා දක්වා ඇති අතර එහි දෙවැන්න චූල වග්ග යයි . චූල වග්ගය කොටස් 14 කින් සමන්විත වන අතර එහි 4 වැන්න **මහා මංගල සූත්‍රයයි.(** සටහන බලන්න.**)** මඞ්ගල සුත්ත , මඞ්ගල ජාතක, සහ මහා මංගල ජාතක වශයෙන් ද සුත්ත පිටකයේ වෙනත් ස්ථානවල ස්ථාපිත වී ඇති ධර්ම ස්කන්ධයන් අපමණය. බුද්ධ දහම යනු මුල සිට අග දක්වාම ඉතාමත් පැහැදිලිව නිරවුල්ව සකසනු ලැබූ එක් එක් පුද්ගලයාගේ ප්‍රඥාවටම සාපේක්ෂව අවබෝධ කරගත හැකි, නිර්වාණ සුවය සාක්ෂාත් කළහැකි ධර්මතාවයකි.

←4→ පිරිත් සජ්ඣායනා

CHANTING PIRITH

පිරිත් පොත 'පරිත්ත සුත්ත දේශනා' සහ 'සූත්‍ර දේශනා' යයි කොටස් දෙකකින් යුක්තය. මෙහි චතුභානවාර පාලියෙහි ඇතුළත් සූත්‍ර, 'පරිත්ත සූත්‍ර දේශනා' වශයෙන් සැලකේ. **මහා මඞ්ගල සූත්‍රය, රතන සූත්‍රය, කරණීය මෙත්ත සූත්‍රය** යන සූත්‍ර 3, තුන්සූත්‍රය ලෙසින් බෞදධ සැදැහැතියන් මහත් භක්තියකින් යුතුව භාවිතා කරමින් දෛනික ජීවිතය තුළ මහත් ඵල ලබයි.

පිරුවානා පොත් වහන්සේ හෙවත් චතුභානවාරපාලියෙහි සඳහන්වන අන්දමට පරිත්‍රාණය හෙවත් පිරිත, දුක පිහිටකොට ඇති සියලු සත්ව ලෝකයාට මෙලොව පරලොව දෙකෙහිම සැප පිණිස වන්නේමය.

සාමාන්‍ය පෘථග්ජන ලෝකයා විසින් ලෙඩ රෝග ආදිය වැළඳීමේදී මෙන්ම වෙනත් උපද්‍රව වලදී ඒවායින් වැළකීමට සහ සහන ලබාගැනීම පිණිස විවිධ උපාය මාර්ග යොදාගනු ලබයි. **එහෙත් ප්‍රඥා සම්පන්න බෞද්ධ ලෝවැස්සන්ට පරිත්‍රාණය හෙවත් පිරිත තරම් උභයාර්ථ සංසිද්ධියට හේතු වූ වෙනත් මගක් නැත්තේමය.**

**විපත්තිපටිබාහාය සබ්බ සම්පත්ති සිද්ධියා
සබ්බ දුක්ඛ විනාසාය පරිත්තං බ්‍රෑථ මඞ්ගලං
විපත්තිපටිබාහාය සබ්බ සම්පත්ති සිද්ධියා
සබ්බ භය විනාසාය පරිත්තං බ්‍රෑථ මඞ්ගලං
විපත්තිපටිබාහාය සබ්බ සම්පත්ති සිද්ධියා
සබ්බ රොග විනාසාය පරිත්තං බ්‍රෑථ මඞ්ගලං**

පිරිතට ආරාධනා කිරීමේදී මෙම ගාථා නිසිලෙස උච්චාරණය කිරීම ඉතා වැදගත්ය. මෙයින් අදහස් වන්නේ සියලු විපත් දුරුවීම පිණිසත්, දුක් බිය රෝග නැතිවීම පිණිසත්, මෙලොව පරලොවදෙකෙහි ඉෂ්ටාර්ථ සංසිද්ධියට හේතු වූ **පිරිත සජ්ඣායනය** කිරීමට ආරාධනා කෙරෙන වගයි. තෙරුවන් නමැදීමෙන් අනතුරුව, එහි ගුණස්කන්ධය සත්‍ය බව නුවණින් පිළිගෙන පිරිත් ධර්මය අසුරු කරන පුද්ගලයා පරලොව සතර අපායාදී දුකෙන් ද, මෙලොව නානාවිධ රෝගාබාධයන් ගෙන් ද, යක්ෂ ප්‍රේත භූත පිශාචාදී අමනුෂ්‍ය උපද්‍රවයන්ගෙන් ද ආරක්ෂා වෙයි.

තුන් සූත්‍රය, ආරම්භ වන්නේ **මහා මඞ්ගල සූත්‍රයෙනි.** එහි නිසි ඵල ලැබීමට අර්ථාන්විතව අවබෝධ කටයුතුමයි.

←5→ මහා මඞ්ගල සූත්‍ර උද්භවය

ORIGIN of THE DISCOURSE ON BLESSINGS

යං මඞ්ගල ද්වාදස්සු - චින්තයිංසු සදෙවකා
සොත්ථානංනාධිගච්ඡන්ති - අට්ඨතිංසඤ්ච මඞ්ගලං
දෙසිතං දේවදෙවෙන - සබ්බ පාප විනාසනං
සබ්බ ලොක හිතත්ථාය - මඞ්ගලං තංභණාමහෙ.

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමේ, අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඕභාසෙත්වා, යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

* * *

Eva.m	**-**	thus
me	**-**	I
suta.m	**-**	heard:
Eka.m	-	one
samaya.m	-	time
Bhagavaa	-	the Blessed One, the Buddha
Saavatthiya.m	-	near Saavatthi
viharati	**-**	was staying
Jetavane	-	in the Jeta Grove
Anaathapi.n.dikassa aaraame	-	in Anaathapi.n.dika's monastery.
Atha kho	-	certainly then
a~n~nataraa	-	a certain
devataa	-	deity, a deva
abhikkantaaya	-	towards, far advanced
rattiyaa	-	night
abhikkantava.n.naa	-	of surpassing brilliance and beauty)
kevalakappa.m	-	the entire
Jetavana.m	-	Jeta Grove
obhaasetvaa	-	having illumined
yena Bhagavaa	-	where the Blessed One was
tena upasa.mkami	**-**	approached that place
upasa.mkamitvaa	-	having reached
Bhagavanta.m abhivaadetvaa		having offered profound salutations to the Blessed One
ekamanta.m	-	aside
a.t.thaasi	-	stood
Ekamanta.m thitaa kho	-	having stood aside
saa devataa	-	the deity
Bhagavanta.m	-	to the Blessed One
gaathaaya	**-**	in verse
ajjhabhaasi	-	addressed respectfully

“මා විසින් මේ සූත්‍ර දේශනාව මෙසේ අසන ලදී. එක් සමයෙක් හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬු සිටුහු ගේ ආරාමයේ වැඩ වසන සේක”

එකල්හි වනාහි එක්තරා දිව්‍ය පුත්‍රයෙක් ප්‍රථම යාමය ඉක්ම වූ කල්හි යහපත් ශරීර වර්ණය ඇතිව, ජේතවන භූමිය බබුලුවා ගෙන යම් තැනක බුදුරජාණන්වහන්සේ වසනසේක් ද එතැනට එළඹියේය. භාග්‍යවතුන්වහන්සේ වැඳ එකත් පස්ව සිටියා වූ දිව්‍ය පුත්‍ර තෙමේ භාග්‍යවතුන්වහන්සේට ගාථාවකින් කරුණක් සැලකර සිටියේය.

එහි අදහස වූයේ, දෙලොව යහපත කැමති දෙවියෝ ද, මනුෂ්‍යයෝ ද, මංගල කරුණු පිළිබඳව සිතමින් පසුවෙන බැවින් ඔවුන්ගේ යහපත උදාකර ගැනීමට හේතුවන මංගල කරුණු දේශනා කරන සේක්වා ! යන්නයි.

* * *

“I heard these words of the Buddha one time when the Lord was living in the vicinity of Savatthi at the Anathapindika Monastery in the Jeta Grove.”

Late at night, a deva appeared whose light and beauty made the whole Jeta Grove shine radiantly. After paying respects to the Buddha, the deva asked him a question in the form of a verse:

“Many gods and men are eager to know what are the greatest blessings, which bring about a peaceful and happy life. Please, Tathagata, will you teach us?”

“බහු දේවා මනුස්සා ච මංගලානි අචින්තයුං” ගාථා පාඨයෙන් ආරම්භ කෙරෙන මහා මඞ්ගල සූත්‍රය වනාහි දස දහසක් සක්වළ බොහෝ දෙවියන් ද, දඹදිව් තලයෙහි සියලු මිනිසුන් ද, සිතමින් සිටි මංගල කරුණු නිරාකරණය කර දෙව් මිනිස් දෙපාර්ශවයේම හිත සුව පිණිස බුදුරජාණන්වහන්සේ විසින් සැවැත්නුවර ජේතවනාරාමයේදී දේශනා කරන ලද දෙවියන්ට මෙන්ම මිනිසුන්ට ඉතා ඵලදායී ප්‍රිය මනාප වූ සූත්‍රයකි.

සර්ව රාත්‍රික පිරිත් පුණ්‍ය කර්ම වලදී ද, මහ පිරිත ආරම්භයේදී විනයෙහි දැක්වෙන **මඞ්ගල සූත්‍රය, රතන සූත්‍රය සහ කරණීය මෙත්ත සූත්‍රය** යන ත්‍රිවිධ අනුමෝදනා අතර සම්ප්‍රදායක් ලෙසින් **මඞ්ගල සූත්‍රය** ආරම්භක සූත්‍රය ලෙසට භාවිතා කෙරෙයි.

Among many other favorite Sutras “the **Maha Mangala Sutra** (Sutta), can be considered as the Happiness Sutra. Though there are many commentaries, this Mangala Sutta is full of easy-to-follow advice. It makes a wonderful daily chant. Here, is the translated English version in verse with rhythm, making it easy to chant as a daily or regular practice.

සියලු සත්වයෝ නිදුක් වෙත්වා! නිරෝගී වෙත්වා !
සුවපත් වෙත්වා !

May all beings be happy and free from suffering !!!

සාධු ! සාධු !! සාධු !!!

*** * ***

←6→ සතුට යනු කුමක්ද ?

What is Happiness

"To be humble and polite in manner,

To be grateful and content with a simple life,

Not missing the occasion to learn the Dharma

This is the great happiness."

** * * Shakyamuni Buddha * * **

* * *

←7→ මහා මඞ්ගල සූත්‍ර ගාථා

Discourse on Blessings

1 බහූ දෙවා මනුස්සා ච
මඞ්ගලානි අචින්තයුං
ආකඞ්ඛමානා සොත්ථානං
බ්‍රෑහි මඞ්ගලමුත්තමං

Bahū devaa manussā ca
Mañgalāni acintayuṃ
ākaṃkhamānā sotthānam
bruuhi mañgalamuttamaṃ

Many gods and men are eager to know
what are **the Supreme blessings**
which bring about a peaceful and happy life.
Please, Tathagata, will you teach us?"

දෙලොව යහපත කැමති දෙවියෝ ද මනුෂ්‍යයෝ ද මංගල කරුණු පිළිබඳව සිතූහ. දෙව් මිනිසුනට අනුකම්පාවෙන් හිත සුව එලවන මංගල කරුණු දේශනා කළ මැනවි.

2 අසෙවනා ච බාලානං
පණ්ඩිතානඤ්ච සේවනා,
පූජා ච පූජනීයානං
එතං මඞ්ගලමුත්තමං.

Asevanā ca bālānaṃ
Panditānañ ca sevanā
Pūjācapūjanīyānaṃ
Etam-maṅgalamuttamaṃ

Not to be associated with the foolish ones,
to live in the company of wise people,
honoring those who are worth honoring,
This is the Supreme Blessing.

අනුවණ, බාලයන් සේවනය නොකිරීම ද, පණ්ඩිතයන් සේවනය කිරීම ද, බුද්ධාදී පිදිය යුත්තන් පිදීම ද, දෙලොව දියුණුව ගෙනදෙන මංගල කරුණුය.

3 පතිරූපදේසවාසො ච
පුබ්බෙ ච කතපුඤ්ඤතා,
අත්ත සම්මාපණිධි ච
එතං මඞ්ගලමුත්තමං.

Patirūpa-desa vāso ca
Pubbe ca katapuññatā
Atta sammā panidhi ca
Etam-maṅgalamuttamaṃ

To reside in the suitable locality,
to have done meritorious actions in the past,
and to set oneself in the right course,
This is the Supreme Blessing.

සුදුසු පෙදෙසක් විසීම ද , පෙර කළ පින් ඇති බවද, සිත මනාව පිහිටුවීමද, උතුම් මංගල කරුණුය.

4 බාහුසච්චඤ්ච සිප්පඤ්ච
විනයො ච සුසික්ඛිතො,
සුභාසිතා ච යා වාචා
එතං මඞ්ගලමුත්තමං.

Bāhu saccañ ca sippañ ca
Vinayo ca susikkhito
Subhāsitā ca yā vācā
Etam-maṅgalamuttamaṃ

To have a chance to learn and grow,
to be skillful in your profession or craft,
practicing the precepts and loving speech
This is the Supreme Blessing..

බොහෝ ඇසූ පිරූ තැන් ඇති බවද, ශිල්ප දැනීමද, මනා හික්මීම ද, සුබස් වදන් බිණීම ද, උතුම් මංගල කරුණුය.

5 මාතා පිතු උපට්ඨානං
පුත්තදාරස්ස සඞ්ගහො,
අනාකුලා ච කම්මන්තා
එතං මඞ්ගලමුත්තමං.

Mātā pitu upatthānam
Puttadārassa sangaho
Anākulā ca kammantā
Etam-maṅgalamuttamaṃ

To be able to serve and support your parents, to cherish your own family,
to have a truthful occupation
This is the Supreme Blessing..

මව්පියනට උපස්ථාන කිරීමද,
අඹුදරුවන්ට සංග්‍රහ කිරීම ද, නිරවුල්
කර්මාන්තය ද, යන මේ කරුණු උතුම්
මංගල කරුණුය.

6 දානඤ්ච ධම්මචරියා ච
ඤාතකානඤ්ච සඞ්ගහො,
අනවජ්ජානි කම්මානි
එතං මඞ්ගලමුත්තමං.

Dānañ ca dhammacariyā ca
Ñātakānañ ca sangaho
Anavajjāni kammāni
Etam-maṅgalamuttamaṃ

Liberality, righteous conduct,
the helping of relatives,
and blameless actions.
This is the Supreme Blessing..

දන්දීම ද, දස කුසල්හි හැසිරීම ද,
නෑයන්ට සංග්‍රහ කිරීම ද,
නිරවුල් කර්මාන්ත ද,
යන මේ කරුණු උතුම් මංගල කරුණුය.

7 ආරති විරති පාපා
මජ්ජපානා ච සඤ්ඤමො ,
අප්පමාදො ච ධම්මෙසු
එතං මඞ්ගලමුත්තමං.

Ārati virati pāpā
Majjapānā ca samyamo
Appamādo ca dhammesu
Etam-maṅgalamuttamaṃ

To avoid unwholesome actions,
not caught by alcoholism or drugs,
and to be diligent in doing good things
This is the Supreme Blessing..

පාපයෙහි නො ඇල්මද, අකුසලයෙන් වෙන්වීම ද, මත්පැනින් වැළකීම ද, හැම කුසල් දහම්හි පමා නොවීම ද, උතුම් මංගල කරුණුය.

8 ගාරවො ච නිවාතො ච
සන්තුට්ඨී ච කතඤ්ඤුතා,
කාලෙන ධම්ම සවණං
එතං මඞ්ගලමුත්තමං.

Gāravo ca nivāto ca
Santutthī ca kataññutā
Kālena dhamma savanam
Etam-maṅgalamuttamaṃ

Reverence, humility,
contentment, gratitude and
hearing of the Dhamma at due time
This is the Supreme Blessing..

ගරුකළ යුත්තන්ට ගරුකිරීම ද, යටහත් පහත් බවද, ලද දෙයින් සතුටුවීම ද, කලගුණ සැලකීම ද, සුදුසු කල්හි දහම් ඇසීම ද, උතුම් මංගල කරුණුය.

9 ඛන්ති ච සොවචස්සතා
සමණානඤ්ච දස්සනං,
කාලෙන ධම්මසාකච්ඡා
එතං මඞ්ගලමුත්තමං.

Khanti ca sovacassatā
Samanānañ ca dassanam
Kālena dhamma sākacchā
Etam-maṅgalamuttamaṃ

Patience,obedience,
sight of the sancitifedones(samanas),
and religious discussions at due seasons
This is the Supreme Blessing..

ඉවසීම ද, කීකරුබව ද, ශ්‍රමණයන් දැකීමද, සුදුසු කල ධර්ම සාකච්ඡාව ද, උතුම් මංගල කරුණුය.

10 තපො ච බ්‍රහ්මචරියඤ්ච
අරියසච්චාන දස්සනං,
නිබ්බාණ සච්ඡිකිරියා ච
එතං මඞ්ගලමුත්තමං.

Tapo ca brahmacariyāñ ca
Ariyasaccāna dassanam
Nibbāna sacchikiriyā ca
Etam-maṅgalamuttamaṃ

Self-control,Holy life,
Perception of the Noble Truth,
And the realization of Nibbana
This is the Supreme Blessing..

තපස ද, උතුම් හැසිරීම ද, සිවුසස් දැකීම ද, නිවන් අවබෝධ කරගැනීම ද, උතුම් මංගල කරුණුය.

11 ඵුට්ඨස්ස ලොකධම්මෙහි
චිත්තං යස්ස න කම්පති,
අසොකං විරජං ඛෙමං
එතං මඞ්ගලමුත්තමං.

Phutthassa loka dhammehi
Cittam yassa na kampati
Asokam virajam khemam
Etam-maṅgalamuttamaṃ

He whose mind does not flutter,by contact with worldly contingencies, sorrow less, stainless and secure
This is the Supreme Blessing..

අටලෝ දහමින් සිත කම්පා නොවේද,
ශෝක රහිත ද, රාගාදී කෙලෙස් දූලි නැත්ද,
බිය රහිතද, මේ උතුම් මංගල කරුණුය.

12 එතාදිසානි කත්වාන
සබ්බත්ථ මපරාජිතා
සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති
තං තෙසං මඞ්ගලමුත්තමංති.

Etādisāni katvāna
Sabbattha maparājitā
Sabbattha sotthim gacchanti
Tam tesam mangala-muttamam ti

To them, fulfilling matters such as these,
everywhere invincible,
in every way moving happily.
These are the Supreme Blessings

මෙබඳු මංගලයෙන් කොට සියලු තන්හි නො පැරදුනාහු සියලු තැන සැපතට යෙති. ඔවුනට **මෙම කරුණු අටතිස, දෙලොවටම යහපත සදාලන උතුම් මංගල කරුණුවේ.**

* * *

මහා	මඞ්ගල	සුත්තං	නිට්ඨිතං

The End of the Discourse on Blessings

* * *

←8 → විවරණය

COMMENTARY

ගාථා රත්නයන් දොළසකින් සැකසී ඇති මෙම මහා මඞ්ගල සූත්‍රය මංගල කරුණු 38 කින් සමන්විතය. සම්බුදු දහම තුළ අන්තර්ගත සෑම කරුණක්ම මිනිසාගේ භෞතික සහ අධ්‍යාත්මික දියුණුව සඳහා පැහැදිලි මාවතක් සකසයි.

එය අනවබෝධයෙන් කරන වැඳුම් පිදුම් වලට සහ අන්ධ විශ්වාසයට ඉඩක් සපයා නැත. එහෙත් සම්බුදු දහම එය පිළිබඳව විමර්ශනාත්මකව සොයා බැලීමට සහ ප්‍රශ්ණ කරමින් අවබෝධක් ඥානය ලබාගැනීමට ඉඩ සපයා ඇත.

අප විසින් කරනු ලබන සියලු කාර්යයන්ට වගකිවයුත්තා වන්නේ අපම බව බුදු දහම උගන්වයි. මෙම උත්තරීතර සම්බුදු දහම, උත්සාහ ගන්නා ඕනෑම අයෙකුට ලභා වියහැකි, අවබෝධ කරගතහැකි, සොයා විමසා බලා අත්දැකිය හැකි, ඉක්මනින් ප්‍රතිඵල ලැබිය හැකි ධර්මයකි. එපමණක් නොව අකාලික වූ මෙම සම්බුදු දහම නූතන විද්‍යාවට ද, ගැලපෙන හෙයින් විද්‍යාත්මක සහ තාක්ෂණික

සංකල්පයන් ඔස්සේ වුවද විමර්ශනයට භාජනය කිරීමට කිසිදු බාධාවක් නැත. අවශ්‍ය වන්නේ භාග්‍යවත් තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් ඉතාමත් පැහැදිලි ලෙස මුල, මැද, අග පිළිවෙළට සකස් කොට දේශනා කරන ලද සන්දිට්ඨික වූ, අකාලික වූ, ඒහි පස්සික වූ, ඕපනයික වූ, ඒ ශ්‍රී සද්ධර්මය, තම තමාගේ නැණ පමණින් ස්වයං විමර්ශනයක් ඔස්සේ අවබෝධ කරගැනීමට වෙර දැරීමයි.

සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් ගාථා 12ක් තුළ කැටිකර දේශනාකරන ලද මහා මඞ්ගල සූත්‍රය තුලින් පෙන්වා දී ඇති මෙම උතුම් මංගල කරුණු 38 අපගේ දෛනික ජීවිතයට කෙතරම් ඵලදායී වන්නේදැයි විමර්ශනාත්මකව තුලනයකර බැලිය යුතුමය. ඒ අනුව ප්‍රඥා ගෝචරව, ධර්මානුකූලව ජීවිත ගතකරන්නෝ අවසානයේදී ලැබුවා වූ මිනිසත් භවයෙහි නිසි ඵල ලබා සදා සුව දෙන නිර්වාණ සැපතට ළඟ වනු ඇත .

The Discourse is a charter in outline of family responsibility, social obligations, moral purification and spiritual cultivation. Within the compass of a dozen stanzas are included profound counsels and golden rules, which admirably point out the way life's journey should go if it is to reach the haven of perfect harmony, love, peace and security. Beginning with emphasis on the need for a suitable environment, the Discourse lays appropriate stress on personal discipline, righteous conduct and adequate discharge of duties to one's near and dear ones. Then the higher virtues of humility, gratitude, patience and chastity are introduced. And step by step are reached serenity, perception of truth and Enlightenment.

Above all the sutta is a wonderful stimulus for reform. It indicates the simple and direct way the Buddha adopted to wean people from superstitions and irrational attitudes so that they could grow and mature towards an enlightened outlook. This gradual method is unique to the Buddha. He made people see **"luck," "omens"** and **"auspiciousness"** in quite a new light, rejecting superstition and encouraging reliance upon one's own good actions. In consequence signs and omens gave way to his emphasis upon social obligations and duties founded on individual good conduct and leading to a society lighted by understanding and individual hearts enlightened by penetration of the truth.

←9→ ආශීර්වාදාත්මක මඞ්ගල කරුණු 38

38 HIGHEST BLESSINGS OF LIFE

1 අනුවණ බාලයන් ඇසුරු නොකිරීම
(aseyanaa ca bala ana.m)
To avoid the company of fools

2. පණ්ඩිතයන් ඇසුරු කිරීම *(p an.ditaana~n ca seyanaa:)*
To associate with the wise

3. බුද්ධාදී පිදිය යුත්තන් පිදීම*(Puujaa ca puujaniiyaana.m:)*
To honour those who are worthy of honour

4. සුදුසු පෙදෙසක වාසය කිරීම*(Patiruupadesavaaso)*
To live in a suitable place

5. පෙර කළ පින් ඇති බව*(Pubbe ca katapu~n~nataa:)*
To have done good deeds in the past

6. සිත මනාව පිහිටුවීම (*Attasammaapa.nidhi:*)
To be on the right path

7. බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව*(Bahusacca~n:)*
To have a good education

8. ශිල්ප දැනීමෙන් ලද කාර්ය නිපුණත්වය
To be proficient at work (*Bahusippa~n:*)

9. මනා හික්මීම *(Vinayo ca susikkhito)*
To follow a code of discipline

10. සුභාෂිත වචන භාවිතය*(Subhaasitaa ca yaa vaacaa)*
To practice pleasant speech

11. දෙමාපියන්ට උපස්ථාන කිරීම
(Maataapitu upa.t.thaana.m:)
To support the parents

12. අඹුදරුවන්ට සංග්‍රහ කිරීම*(Puttadaarassa sa"ngaho)*
To take care of spouse and children

13. නිරවුල්, යහපත් රැකියාවක යෙදීම
(Anaakulaa ca kammantaa:)
To have occupations which do not cause harm

14. දන් දීම *(Daana:)* - To be charitable

15. කුසල ධර්මයන්හි යෙදීම*(Dhammacariyaa)*
To practice virtuous conduct.

16. ඥාති මිත්‍රාදීන්ට සංග්‍රහ කිරීම(*Naatakaana~n ca sa"ngaho)*
To be of help to relatives and friends

17. නිරවුල් නිවැරදි කර්මාන්තයන්හි යෙදීම
(Anaakulaa ca kammantaa)
To engage in blameless activities.

18. පාපකර්මයන් ගෙන් වැළකීම *(Aarati paapaa)*
To abstain from evil.

19. අයහපත් කටයුතු හෙවත් වරද පිටු දැකීම
To have no desire for evil*(Virati paapaa)*

20. මත්වතුර සහ මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීම
To refrain from intoxicants *(Majjapaanaa ca sa~n~namo)*

21. සියලු කුසල් දහම්හි පමා නොවීම
(Appamaado ca dhammesu)
To be diligent in wholesome practice.

22. ගරු කළ යුත්තන්ට ගරු කිරීම
To have reverence *(Gaaravo)*

23. යටහත් පහත් බව *(Nivato)*To be humble

24. ලද දෙයින් සතුටු වීම*(Santu.t.thi)*
To be content

25. කළගුණ සැලකීම*(Kata~n~nutaa)*
To be grateful

26. සුදුසු කල්හි දහම් ඇසීම *Kaalena ammasavana.m*
To hear the Dhamma at the right time

27. ඉවසීම (*Khantii)* -To have patience

28. අවවාදයට කීකරුවීම *(Sovacassataa)*
To listen to advice
29. ශ්‍රමණයන් දැකීම *Sama.naana~n ca dassana.m:)*
To see monks and spiritual teachers
30. සුදුසු කල්හි ධර්ම සාකච්ඡාවෙහි යෙදීම
Kaalena dhammasavana.m
To discuss Dhamma at due season
31. තපස හෙවත් තවුස්දම්හි නියැලීම *(Tapo)*
To practice self-restraint
32. උතුම් හැසිරීම *(Brahmacariyaa)*
To live according to the Noble 8-Fold path
33. සිවුසස් දැකීම *(Ariyasaccaana dassana.m)*
To understand the Four Noble Truths
34. නිවන් අවබෝධකර ගැනීම *(Nibbaana sacchikiriyaa)*
To attain Nibbana
35. අටලෝ දහමින් සිත කම්පා නොවීම
(Phu.t.thassa lokadhammehi citta.m yassa na kampati)
To be unaffected by worldly conditions
36. ශෝක රහිත බව *(Asoka.m:)*
To be free from sorrow
37. රාගාදී කෙලෙස් දූලි නොමැති බව *(Viraja.m)*
To be free from defilement
38. බිය රහිත සැනසිලි දායක බව *(Khema.m)*
To have lasting peace and security

මෙබඳු මංගල්‍යයන් සිදු කොට සියලු තන්හි නොපැරදුණාහු සියලු තැන සැපතට යෙති. ඔවුන්ට මෙම කරුණු 38 දෙලොව වැඩ සදාලන උතුම් මඞ්ගල කරුණු වෙති.

* * *

←10→ සාර්ව දැක්මක්

GENERAL REVIEW

මඞ්ගල කරුණු 38 කින් සමන්විත මහා මඞ්ගල සූත්‍රය, ඉතාමත් පැහැදිලිව එකින් එකට කරුණු ගැලපෙන පරිදි, පවත්නා ජීවිතය තුළ අත්දැකිය හැකි, හරවත් උපදේශයන් ගෙන් සමන්විතව අනුපිළිවෙලින් සකස් කරන ලද්දකි.

දෛනික ජීවිතය තුළ යහපත, සමුර්ධිය, වාසනාව, සතුට ළඟ කරගැනීම සඳහා, තම බුද්ධියට සාපේක්ෂව තුලනයකර ස්වකීය අවබෝධය තුළින් අනුගමනය කළයුතු, එමෙන්ම කළහැකි, එදිනෙදා ජීවිතයට මහත්සේ බලපාන පුද්ගල ඇසුර පිළිබඳ වටිනා උපදේශයකින් ඇරඹෙන මෙම මහා මඞ්ගල සූත්‍රය, අවසානයේදී ලෞකික ජීවිතයෙන් ඔබ්බට යන ලෝකෝත්තර සුවය ළඟා කරගත හැකි උතුම් හරවත් උපදේශයන් ගෙන් සමන්විතය .

එබැවින් මේ දක්වා සංෂිප්තව දැන සිටි මෙම කරුණු 38 සමස්ථයක් වශයෙන් ගෙන පුළුල් වූ දර්ශනයක් ඔස්සේ අවබෝධ කටයුතුමය. එවිට දහම් මාවතේ තමා සිටින ස්ථාවරය පැහැදිලිවම ස්වකීය අවබෝධයට හසුවන හෙයින් එතැන් සිට දහම් මගෙහි ඉදිරියට පියවර නැගීමට පහසුවනු ඇත.

The thirty-eight blessings detailed in the Maha Mangala Sutta are not arranged in random order. Their arrangement is strictly logical and their sequence is natural and progressive. Up to this point we have dealt with the various issues individually because an analytic study was necessary for the proper understanding of the subject.

Now, with the perspective of the entire sutta, we are in a position to consider the subject as a whole. This enlarged view, while giving as a chance to appreciate the cultural integrity of the sutta, also gives an understanding of the synthesis of its thirty-eight constituents. These constituents are so arranged that they not only follow one another in proper sequence, but they also group themselves into categories which are in the progressive order of development in Dhamma.

එක් එක් ගාථාවන්ගෙන් ඉදිරිපත් කෙරෙන කරුණු අනුපිළිවෙලින් පැහැදිලිව විමසුම් නුවණින් සලකා බැලීම වඩාත් ඵලදායී වනු ඇත.

1 වන ගාථාව : පළමු ගාථාවෙන් ඉදිරිපත් වන්නේ මංගල කරුණු නොව මංගල කරුණු දේශනා කර වදාරණ මෙන් තිලෝගුරු සම්මා බුදු රජාණන්වහන්සේ අබියසට පැමිණි දෙවියන් විසින් කරනු ලැබූ ඉල්ලීමයි.

Stanza I

The Buddha was asked: What are the highest Blessings in life? The Blessed One replied: The Supreme Blessings are: as follows.

2 වන ගාථාවේ සිට **12** ගාථාව දක්වා මඞ්ගල කරුණු **38** අන්තර්ගත වී ඇති අතර අවසාන ගාථාවෙන් පෙන්වා දී ඇත්තේ එම මඞ්ගල කරුණු තම ජීවිතය තුළින් දකින්නන් කිසිවිටක පරාජය නොවන බවත් සියලු තන්හි සැපතට පැමිණෙන බවත් අවසානයේදී දෙලොවම ජයග්‍රහණය පිණිස එම උතුම් මඞ්ගල කරුණු **38** ඍජුවම බලපෑමක් ඇතිකරවන බවත්ය.

එබැවින් සාමාන්‍ය දෛනික ජීවිතයේ අනුගමනය කළ හැකි, ස්වකීය යහපත පිණිස අනුගමනය කළයුතු, ඉතාම වැදගත් **උපදේශයන් 38 ක් ඇතුළත්** මෙම ගාථාවන් දෙස විමර්ශනාත්මක නුවණින් යුතුව අවබෝධ කටයුතුමය. නිවැරදි ලෙස මෙම උතුම් මඞ්ගල කරුණු අවබෝධ කරගන්නෝ සියලු දුක් දොම්නස් කෙළවර කර පතන්නාවූ බෝධියකින් පරම රමණීය වූ අමූර්ත මහ නිවන් සුව පසක් කර ගනී.

බුදු දහම ස්වකීය යහපත පිණිස ප්‍රායෝගිකව අනුගමනය කළයුතු ක්‍රියාමාර්ගයකි. එබැවින් තම තමාගේ ශ්‍රද්ධාවට අනුව ගොඩනැගෙන ප්‍රඥාව ඔස්සේ මෙම උතුම් දහම් කරුණු තම ජීවිතය තුල ප්‍රායෝගීකරණය කර එතුළින් ලබන්නා වූ අත්දැකීම් ඔස්සේ, ලැබුවාවූ මිනිස් භවය සාර්ථක කරගැනීමට නිසි මඟ පෙන්වීමක් මෙම මහා මඞ්ගල සූත්‍රය තුළ අන්තර්ගතය. එක් එක් ගාථාව තුළ මඞ්ගල කරුණු 3ක් හෝ 4ක් අන්තර්ගතය. මෙතැන් සිට එම කරුණු එකිනෙකට වෙන් වෙන් වශයෙන් පැහැදිලි කෙරේ.

Buddhism is a Teaching that:

1. *Provides a clear path for spiritual and personal development .*

2. *Has no room for blind faith or unthinking worship.*

3. *Encourages questions and investigations into its own teachings.*

4. *Teaches us to take full responsibility for all of our actions.*

5. *Can be approached, realized and experienced, with immediate results.*

6. *Is very much in harmony with modern science.*

1 බාලයන් ආශ්‍රය නොකිරීම
(*aseyanaa ca bala ana.m:)*
Not associating with fools

මෙහිදී බාලයන් යනුවෙන් අදහස් වන්නේ වැරදි, නිවැරදි දෙය අවබෝධ කරගත නොහැකි, තම අත්තනෝමතික ක්‍රියාවන් නිසා තමාට මෙන්ම අන් අයටත් හානි පමුණුවන පුද්ගලයින් **විනා** වයසින් අඩු අය නොවේ.

අනවබෝධයෙන් එවැනි බාලයන් ඇසුරු කිරීමෙන් කිසිම ආකාරයේ භෞතික හෝ අධ්‍යාත්මික දියුණුවක් ඇති නොවේ. බාලයා තමාට දියුණුවීමට ඇති ඉඩ කඩද අසුරමින්, තමා විසින් සිදුකිරීමට වෙහෙසෙන යහපත් ක්‍රියාවක් වේ නම් එයට ද බාධා පමුණුවමින්, ඔහුගේ අධම චර්යාවන්, තමාගේ චිත්ත සන්තානය තුළ රෝපණය කිරීමට වෙර දරයි.

එදිනෙදා ජීවිතයේදී පුද්ගල ඇසුර ඉතා වැදගත්ය. බාලයා නිසි ලෙස හඳුනා ගැනීම ඉතාමත් සූක්ෂම ලෙස සිහිබුද්ධියෙන් කළයුතු අතර එවැන්නන්ගේ ඇසුරෙන් ඈත්වීම හෝ ඔවුන් අතරේදී **ආර්ය තුෂ්ණීම්භූත භාවයෙන් ප්‍රඥා ගෝචරව** කටයුතු කිරීම ඉතා වැදගත්ය. බාලයින්ගේ ඇසුර දෙලොවම විනාශයට හේතුවන බව අවබෝධ කටයුතුමය. මෙය මඞ්ගල සූත්‍රය ආරම්භයේදීම **පළමුවන මඞ්ගල කරුණ** ලෙසට බුදුරජාණන්වහන්සේ පෙන්වාදී ඇත්තේ එබැවිනි.

Fools are people who are unable to tell right from wrong, and their actions cause harm to others. They are not concerned with basic morality as they do not care the consequences of their actions.

By associating unmindfully with such people, it will be difficult to make any kind of material or spiritual progress as there is always the tendency to behave in a similar manner. Furthermore, there will be hardly any desire or motivation to do good deeds or improve oneself.

However, we must be prepared to lend assistance if it is needed and also help others to improve themselves. Thus we should not totally avoid the fools. What is important is that we remain mindful at all times and never allow ourselves to be adversely influenced by them.

This blessing is right at the top of the Buddha's list and is clearly the single most important blessing for any individual to have, because without this blessing there will be none to follow and nothing can be achieved for the progress of life.

This 1st Blessing is very important as it plays a vital role throughout the life not only secularly but physically and also spiritually.

② පණ්ඩිතයින් ආශ්‍රය කිරීම

(pan.ditaana~n ca seyanaa:)

Associating with the wise.

මෙම දෙවන මඞ්ගල කරුණ දෙවන ගාථාව තුළම ඇතුළත් වී ඇති දෙවන මඞ්ගල කරුණ වූ "පණ්ඩිතයින් ආශ්‍රය කිරීම" යි.

මෙහි පණ්ඩිතයන් යනුවෙන් අදහස් වන්නේ හරි වැරදි අවබෝධ කරගැනීමට තරම් ප්‍රඥා සම්පන්න වූ බුද්ධිමතුන් ය. ඔවුන් තමා අනතුරෙන් වැළකී අන් අයද අනතුරෙන් වළකා ගනී.

තමා විසින් සිදු කරනු ලබන කාය කම්ම, මනෝ කම්ම, වචී කම්ම මෙම භවයට පමණක් නොව ඉදිරි සංසාර ජීවිතයට ද බලපාන බව විශ්වාස කරයි. ඔවුන් ඇසුරු කරන්නා යහපතට ම යොමු කරයි. අයහපතෙන් වළකයි.

එවැනි පුද්ගලයන් සත්පුරුෂයන් සේ සලකා ඇසුරට ළඟාකර ගැනීම අපගේ ලෞකික ජීවිත සාර්ථකත්වයට මහත් සේ ඉවහල් වන අතර අධ්‍යාත්මික වශයෙන්ද සංවර්ධනයක් විනා කිසිවිටෙකත් පරිහානියක් නොවනු ඇත. එවැන්නන් හඳුනාගෙන ඇසුරට ළඟා කර ගැනීම, **දෙවන මඞ්ගල කරුණ** ලෙසට බුදුරජාණන්වහන්සේ පෙන්වා දී ඇත්තේ එබැවිනි.

The wise are those who have acquired the wisdom to tell right from wrong and thus avoid causing harm to others. They are aware that their actions have consequences on not only their present life, but in their future lives too. They discourage wrong-doing and encourage doing good deeds.

We should always try to associate with such upright and virtuous people as proper friendships are of absolute importance in our lives, no matter what stage of progress we have reached.

Having friendships with such morally characterized people as mentioned in the above, there will be no decline in the lives other than a vivid development of the person not only mentally but also spiritually. That is why the Buddha has pointed out this vital fact as the 2nd Blessing of the Discourse. It absolutely plays a vital role giving benefit for the sustained lives.

3. බුද්ධාදී පිදිය යුත්තන් පිදීම

(*Puujaa ca puujaniiyaana.m:)*

Reverencing those worthy of respect

බුදු, පසේබුදු මහරහතන් වහන්සේලා ප්‍රමුඛ ත්‍රිවිධ රත්නයම නිරතුරුවම වන්දනීයත්වයට පූජනීයත්වයට පාත්‍රව ඇත. අපගේ දෙමාපියන්, වැඩිහිටියන් සහ ගුරුවරු ද නිරන්තර යෙන්ම වන්දනීයත්වයට සහ ගෞරව අභිමානයට පාත්‍රවන බව බුදුරජාණන්වහන්සේ පෙන්වා දෙයි. ඔවුන්ගෙන් ලැබෙන්නාවූ ආශිර්වාද ආයුෂ, වර්ණ, සැප, බල ඇතිකරවීමට මහත්සේ ඉවහල් වන අතර අධ්‍යාත්මික සංවර්ධනයක් පුද්ගල සන්තානය තුළ නිරතුරුවම ඇති කරවයි. මෙය මඞ්ගල සූත්‍රයේ පෙන්වාදී ඇති **3 වන මඞ්ගල කරුණයි.**

The Buddha, Paccheka Buddha, Arhanth and the Noble Triple Gem are worthy of respect, honor and venerated. Apart from them, the Buddha pointed out that our parents, elders and teachers are the people we should honour and respect. We can respect them materially or through our conduct. By giving them due respect and honour, we can benefit from their guidance and continue to learn from them.It greatly influences to have a long life, Pleasant look, Happiness and Discriminate Strength due to the improving intellect. This is the 3rd blessing of the Discourse.

4. සුදුසු පෙදෙසක වාසය කිරීම (*Patiruupadesavaaso*) Living in a suitable locality

සූත්‍රයේ දෙවන ගාථාව තුළ ඇතුළත් පළමුවන කරුණයි. මෙහි අදහස්වන සුදුසු ස්ථානය භෞතික ලෝකයට සාපේක්ෂව මෙන්ම අධ්‍යාත්මික සංහිඳියාවකට ගැලපෙන වාතාවරණයක් ඇති පෙදෙසකි. ජීවිත හා දේපල ආරක්ෂාව මෙන්ම ස්වකීය අධ්‍යාත්මික සංවර්ධනය හා ආගමික සංහිඳියාවකට හිතකර සාමකාමී පරිසරයක් වීම ඉතා වැදගත්ය. මෙවන්වූ යහපත් සුන්දර භූමි පෙදෙසක වාසය කිරීම දෙලොව ම යහපත පිණිස හේතුවන 4 වන මඞ්ගල කරුණයි.

A suitable place has both a material and spiritual meaning. Materially, it means a peaceful place where life and property are reasonably secure. Spiritually, it means a place and time where the teachings of the Buddha are known, and where one is able to learn and practice the teachings of Buddha in peace. The blessing of living in a suitable place allows for both material and spiritual progress. So this blessing brings the benefit not only for this world but for the world that comes next.

⑤ පෙර කළ පින් ඇති බව
(*Pubbe ca katapu~n~nataa:)*
Having made merit in the past.

අප අස්වැන්න වශයෙන් නිරතුරුවම නෙලා ගන්නේ අප විසින්ම පෙර සසර ගමනේදී වපුරා ගනුලැබූ කර්මයන්හි ඵල විපාකයන්ය. යහපතෙහි යෙදෙමින් අනුන්ගේ ද සුබ විහරණය වෙනුවෙන් තම කාලය ධනය ශ්‍රමය කැප කළේ නම් එහි සුබ විපාක තමා කරා සෙවණැල්ල මෙන් පසුපස පැමිණෙන අතර, තමාට මෙන්ම අන් අයටත් අයහපත සිදුකළේ නම් එහි දුක් විපාකද අත් නොහැරම තමා පසුපසම ලුහු බඳී. මේ භවයේදී සිදුකරනු ලබන යහපත් හෝ අයහපත් කර්මයන්ගේ ඵල, ඉදිරියේදී තමා වෙතම ලැබෙනු ඇත. එබැවින් දෙආකාරයක ආශීර්වාදයක් මෙම 5 වන මඞ්ගල කරුණ තුළ පවතී.

We are continually reaping the results of our past actions. For example, if we had helped many people in the past, it is likely that when we require help ourselves, we will have the aid of some of the people whom we had previously helped. In the same way, if we continue to help others now, it is likely that in the future we will have the assistance of someone we had just helped. Thus, we must continue doing good deeds for the future. It is a twin blessing to have done good deeds in the past, and to be able to continue to do good deeds for the future.

6. සිත මනාව පිහිටුවීම (*Attasammaapa.nidhi:*) To be on the right path

තමා යන ගමන් මඟ පිළිබඳව පැහැදිලි අවබෝධයක් නොමැති බොහෝ දෙනෙක් තමා වැරදි මඟ ගමන් කරන බව නොදනී. යායුතු නිවැරදි මාවත පිළිබඳව එපමණකින් වත් අවබෝධයක් ලබා නැති ඔවුන් දුෂ්චරිතයේ යෙදෙමින් රාග, ද්වේෂ, මෝහා දී කෙලෙස් වගුරවයි. නිවැරදි මඟ ගමන් කරන්නෝ සදාචාරාත්මකව, උදාරත්වයෙන් නිර්ලෝභීව පරිත්‍යාග කරමින් ප්‍රඥා සම්පත්තියෙන් යුතුව සුචරිත යෙහි යෙදෙයි. තමාට මෙන්ම අන් අයටද යහපත සිදුකරයි. එවන් වූ අධ්‍යාත්මික සහ භෞතික දියුණුවක් සඳහා සිත මානව පිහිටුවා ගැනීම **6 වන මඞ්ගල කරුණයි**.

Many people do not even know that they are on the wrong path, much less being aware of the right path that they should take. The wrong path is that of immorality, greed and ignorance. The right path is that of virtue, generosity and wisdom. It is thus a great blessing to know the right path, and to set oneself on this path of material and spiritual-progress. **This 6th virtuous fact** brings the prosperity for a healthy life not only physically but mentally and also spiritually.

7. බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව
(*Bahusacca~n:)*

Profound learning: good education

අධ්‍යාපනය, අදාළ සාමාන්‍ය විෂයයන්ගෙන් ලබන දැනුම මෙන්ම සාරධර්ම සහිත ගුණදම් පෝෂණයකින් ලබන්නාවූ දැනුමෙන් ද පරිපූර්ණ වීම ඉතා වැදගත්ය. පවත්නා භෞතික ලෝකයේ අරමුණු සාක්ෂාත් කරගනිමින්, තරඟකාරී විභාග ආදියෙන් උසස් ලෙස සමත්ව ලෞකික දියුණුවක් අපේක්ෂා කළ හැකි නමුත්, බුදුරජාණන්වහන්සේගේ ඉගැන්වීමට අනුව යහගුණ පෝෂණයක් ලබා නොමැත්තේ නම්, එම උගත්කමින් ඵලක් නොවනු ඇත.මෙම මංගල කරුණ නිසි පරිදි අවබෝධ කර නොගැනීමෙන් තම සුඛවිහරණය ගැන පමණක් සිතා තම දෙමාපියන් වැඩිහිටි නිවාසවලට පලවා හැරීමට තරම් පුද්ගලයා අකාරුණික වනු ඇත.භෞතික හා අධ්‍යාත්මික සමුර්ධියක් සඳහා ඉවහල්වන **මෙම 7වන මඞ්ගල කරුණ පූර්ණ අධ්‍යාපනය වඩාත් පැහැදිලි කරයි.**

This refers to both a general as well as a moral education. A good general education is essential for our material welfare and a good moral education, such as learning the Buddha’s teachings, is important for our spiritual welfare. 'Profound learning' clarifies in the **7th virtuous fact** is consisted not only with general appropriate education but also with spiritual upliftment.

8. ශිල්ප දැනීමෙන් ලද කාර්ය නිපුණත්වය (*Bahusippa~n:*)
To be proficient at work

නිසි අධ්‍යාපනය තුළින් ලද දැනුම සහ කුසලතාවන්ට සාපේක්ෂව කුමන රැකියාවක නියුතු වුවද, එය තමාටත් අන් අයටත් යහපත පිණිස වන ගෞරවණීය රැකියාවක් ලෙසින් කාර්යක්ෂම ලෙස පවත්වා ගැනීම මෙයින් අදහස් කෙරෙයි. එවන් වෘත්තියක් හමුවේ ලබන්නාවූ වේතනය තමාගේත්, පවුලේ අන් අයගේත් යහපත් පැවැත්ම පිණිස යෙදවීමෙන් නිසි ප්‍රතිඵල ලැබිය හැකි අතර, සමාජ අසම්මත නීති විරෝධී වැරදි ආකාරයේ ක්‍රම මගින් මුදල් ඉපයීමට මෙම **මඞ්ගල** කරුණ ඔස්සේ ඉඩ සපයා නැත. යහපත් දිවි පැවැත්මක් සඳහා බොරුවෙන් වංචාවෙන් තොරව **හෘදය** සාක්ෂියට එකඟව තෘප්තිමත්ව රැකියාවෙහි කාර්යශීලීව **නිරතවීම, 8 වන කරුණ ලෙසට මඞ්ගල සූත්‍රයේ පැහැදිලි කෙරෙයි.**

We should be able to support ourselves and our family. In order to do so, we have to be able to earn a decent living. Whatever we do as the job we must have the necessary skills and qualifications and should be able to apply them properly to our work. Being able to earn a proper living, and not having to struggle to survive or resort to dishonesty or crime, is essential for both material and spiritual advancement.

9. මනා හික්මීම (*Vinayo ca susikkhito*)
well learned moral discipline

මනා හික්මීමක් සඳහා නිශ්චිත ක්‍රියාදාමයක් දිනපතා අනුගමනය කළයුතු බව සම්බුදු පියාණන් වහන්සේ අනුදැන වදාළහ. එම ශික්ෂණය ලැබීම සඳහා ශික්ෂාපද 5ක් ඇති අතර එය රැකීමෙන් සිත කය වචනය සංවර වෙයි. ස්වකීය සුචරිතය වර්ධනයට මෙන්ම, නරක නපුරු අයහපත් ක්‍රියාවන්ගෙන් වැළකීමටත්, විනාශකාරී දරුණු විපත් රෝග පීඩා ආදිය දුරුවීමටත් මහත්සේ ඉවහල් වනු ඇත. **මෙය 9 වන මඞ්ගල කරුණයි.**

1. පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
2. අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
3. කාමේසුමිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
4. මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
5. සුරාමේරයමජ්ජපමාදට්ඨානාවේරමණීසික්ඛාපදංසමාදියාමි.

Observing the 5 Precepts strengthens our resolve and ability to avoid immoral and harmful actions. Following such a code of discipline will keep us from the trouble and difficulties that such negative actions eventually bring.

1 To abstain from killing any living beings.
2. To abstain from taking what is not given.
3. To abstain from sexual misconduct.
4. To abstain from telling lies.
5. To abstain from intoxicating drinks and drugs which cause heedlessness

10 සුභාෂිත වචන භාවිතය
(*Subhaasitaa ca yaa vaacaa)*
To practice pleasant speech

සමාජගත පුද්ගලයා සාමුහිකව ජීවත්වීමේදී වචනයට හිමිවන්නේ ප්‍රධාන තැනකි. වචනය සමාජගත පුද්ගලයාට ඉතා වැදගත්ය. එය බොරු බස් , අවලාද, ඔපදූප, හිස් වචන, ආදියෙන් අවභාවිත කරන්නේ නම් එය මහත් විපතකට හේතු වෙයි. එවන් වදන් භාවිතා කරන්නෝ අපකීර්තියට මෙන්ම සමාජයේ ගැරහුමට පාත්‍ර වෙයි. විරුද්ධවාදීන් වැඩිවෙයි. එය පුද්ගලයාගේ භෞතික සහ අධ්‍යාත්මික දියුණුවට මහත්සේ බාධා පමුණුවයි. යහපත් මානසිකත්වයකින් යුතුව දෛනික කටයුතුවල යෙදීමට ඔහු අපොහොසත් වෙයි. ස්වකීය දියුණුවට මෙන්ම අන්අයගේ යහපතටද හේතු වන අර්ථවත්, ඵලදායී, ප්‍රසන්න මෙන්ම සත්‍ය වූ වචන නිතරම භාවිතා කිරීම **10 වන මඞ්ගල කරුණ ලෙස දැක්වෙයි.**

Speech is our main form of interaction with others in society. If we were to always lie, gossip, scold or speak ill of others, we will have many enemies and people will dislike and distrust us. This will hinder greatly the material and spiritual progress we hope to achieve. We should thus always speak what is true, meaningful, pleasant and beneficial for the good of ourselves and others too.

11 දෙමාපියන්ට උපස්ථාන කිරීම

(Maataapitu upa.t.thaana.m:)

Giving support to parents.

දෙමාපියන් යනු අපට මෙලොව මිනිසත්බව ලැබීමට තිබූ අයිතිය සුරක්ෂිත කර දීම පමණක් නොව උපන් දා සිට පෝෂණය කරමින් හදා වඩා, නිසි අධ්‍යාපනයද ලබාදෙමින් අපගේ දිවි මග ආලෝක කළ ඇත්තෝ වෙති. අප ඔවුන්ට සදා ණයගැති බව බුදුරජාණන්වහන්සේ ශ්‍රී මුඛයෙන් දේශනා කර ඇත. එම ණය බරින් නිදහස් වීමට ඇති එකම මාර්ගය නම් ඔවුන් කෙරෙහි දයාව කරුණාව දක්වමින්, ඔවුන් පිළිබඳව සොයාබලමින්, ශාරීරික භෞතික සියලු අවශ්‍යතා සපුරා දී ඔවුන්ව තව දුරටත් දහම් මඟට යොමු කරවීම බව ධර්මයේ පෙන්වාදී ඇත. මෙවන් උපස්ථානයක් දෙමාපියන් වෙනුවෙන් ඉටුකිරීම තම ජීවිත අභිවෘධියට හේතුවන **11 වන මඞ්ගල කරුණ** ලෙස පෙන්වාදී ඇත.

Our parents brought us into this world and cared for us from birth. It is only the most heartless and uncaring individuals who will not help their own parents. We must show gratitude by supporting them materially and physically when it is required, and by always returning their love and care. The Buddha said that the only way we can ever fully repay our parents is to share and encourage them to practice the Dhamma.

12. අඹුදරුවන්ට සංග්‍රහ කිරීම

(Puttadaarassa sa"ngaho)

Cherishing wife and children.

මූලික සමාජ ඒකකය වන 'පවුල' තුළ මෙය අනිවාර්ය කාර්ය භාරයක් ලෙසට පෙන්වාදී ඇතත් එම වගකීම පැහැරහරින අන්ධ බාලයින් නැත්තේ නොවේ. අන්‍යෝන්‍යවිශ්වාසය පළුදු වීමට ඉඩ නොතබා ඔවුන්ගේ භෞතික අවශ්‍යතා සපුරාලමින් නිසි රැකවරණය සපයමින්, දරුවනට හොඳ අධ්‍යාපනයක් ලබාදීම ස්වකීය අභිවෘධියට හේතුවන්නකි. එම අධ්‍යාපනය දරුවන්ගේ දීර්ඝ කාලීන සාමය සතුටට හේතු වන්නා වූ ධර්ම ඥානයෙන්ද පරිපූර්ණ වියයුතුමය. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් තොරව පවුලේ සාමය සමගිය පවත්වා ගැනීමද, අඹු දරුවන්ට කරනු ලබන නිසි සංග්‍රහයක් ලෙස සැලකේ. පවුල් පසුබිමක ස්වකීය අභිමතාර්ථ සාධනයට ඇති ඉඩකඩ බහුල වන මෙම යථාර්ථය, **12 වන මඞ්ගල කරුණ** ලෙස දක්වා ඇත.

Although this seems obvious enough, there are people who do not fulfil this basic duty towards their families.We must support and remain faithful to our spouse, and provide for our children with material needs, parental support and a good education: including the vital duty of teaching Dhamma for their own long-lasting peace and happiness. Taking proper care of the family and engaging in household with peace and harmony brings another important necessary factors for spiritual development.

13. නිරවුල්, යහපත් රැකියාවක යෙදීම

(Anaakulaa ca kammantaa:)

Engaging in peaceful occupation

නිවන් අරමුණු කරගත් අයෙක් ගමන් කළ යුතු ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ පෙන්වාදී ඇති පරිදි ආයුධ වස විස, මස් මාංශ අලෙවිය සහ එවන් දේ අලෙවිය සඳහා සකස් කිරීම යහපත් රැකියාවන් නොවේ. ආචාර සම්පන්න නොවන අධර්මවාදි, නීතිවිරෝධී රැකියාවන් ද අත් හළ යුතු බව බුදු දහමේ පෙන්වා දෙයි. අන් අයට හානි වන අන්දමේ රැකියාවක නියුතු වීමෙන් අධ්‍යාත්මික සංවර්ධනයට බලපාන සැබෑ මානසික තෘප්තියක් ලද නොහැක. යහපත් රැකියාවක යෙදීම, අන් අයගේ සුභසිද්ධියට හේතුවන අතර, එතුළින් උපයන මුදල සාධාරණ හෙයින් තම ජීවිතාභිවෘධියට එය මහත් වූ ආශිර්වාදයක් වනු ඇත. මතභේද ගැටුම් ආදියට හේතු නොවන යහපත් රැකියාවක යෙදීම, **13 වන මඞ්ගලකරුණයි**.

According to the Noble Eightfold Path, we should avoid occupations that involve killing, the sale of animal flesh, the trading of humans, weapons, poisons and intoxicants. Occupations which are unethical, immoral and illegal should also be avoided. Engaging in any work which causes harm to others will never allow anyone the true peace of mind essential for spiritual development. It is thus a great blessing if we can earn a living by means which are free from unwholesome activities.

14. දන් දීම
(Daana:)
To be charitable

දුක් වේදනාවන්ට හේතුවන්නේ ආශාව තණ්හාව සහ දැඩි බැඳීමයි. පරිත්‍යාගය පුහුණු කිරීමෙන් එයට පටහැණි වූ දයාව, කරුණාව පරාර්ථකාමිත්වය නිර්ලෝභීත්වය වර්ධනය වෙයි. ද්‍රව්‍යමය දේ පරිත්‍යාග කිරීම හෝ ආධාරදීම බොහෝසෙයින් භෞතික ලෙස සිදුකරනු ලබන දානයන් වන අතර, ධර්මය බෙදා හදා දීමට කොටස්කරුවෙකු වියහැකි නම් එය උසස්ම දානය ලෙසට අධ්‍යාත්මික යහපතට හේතුවෙයි. පරිත්‍යාගය, වීමංසන බුද්ධියෙන් යුතුව පිරිසිදු චේතනාවෙන්, නැවත සිහිකිරීමේදී සතුටු වියහැකි ආකාරයෙන් සිදුකිරීමට පුරුදු පුහුණු විය යුතුය. අනෙකෙකු කෙරෙහි දක්වන දයාව කරුණාව තමා කෙරෙහි පරාවර්තනයවෙයි. අනාගතයේදීද ස්වකීය සුරක්ෂිතභාවය වඩාත් තහවුරු කරවමින් උසස් පරිත්‍යාග කිරීමට හැකි ස්ථාවරයකට පමුණුවන මෙම කරුණ, **14 වන මඞ්ගල කරුණයි .**

Greed, craving and excessive attachment are causes of misery and suffering. By practicing charity, we weaken these negative traits and instead cultivate compassion, generosity and selflessness. We can help others materially through our efforts or donations, or spiritually by sharing the Dhamma. Charity should be practiced without regret, discrimination or ulterior motives. Genuine kindness to others brings much love and goodwill for us and also for our family. It is a great blessing to be in the fortunate position of being able to help others. By doing so we ensure ourselves with more blessings in the future too.

15. කුසලධර්මයන්හි-යෙදීම***(Dhammacariyaa)***
To practice virtuous conduct

ධර්මයෙහි යෙදෙන්නා අකුසල ධර්මයන්ගෙන් සහ වැරදි ක්‍රියාවන්ගෙන් වළක්වාලයි. සිල් පද 5 කින් ආරම්භකර අට සිල්, දසසිල් ආදී ඉහළ ස්ථරයකට පිවිසීමෙන් විශාල අධ්‍යාත්මික දියුණුවකට මග පැදෙයි. මෙය ක්‍රමයෙන් පුහුණුවිය යුතු දෛනික ජීවිතයට මහත්සේ සෙත සැලසෙන මංගල කරුණකි. සීලය මගින් පුරුදු පුහුණුවන අවිහිංසාව, දයාව, කරුණාව, නිර්ලෝභී බව, ශ්‍රද්ධාවන්ත බව, වගකීම, සත්‍යවාදී බව, වාග් සංවරය, ආත්ම සංයමය සහ සිහි කල්පනාව හෙවත් සතිය ආදී ගුණාංග වර්ධනය කරගැනීම පුද්ගලයෙකුගේ ලෞකික මෙන්ම ලෝකෝත්තර සුවයට හේතුවන බැවින් **15** වන මඞ්ගල **කරුණ ලෙස** පෙන්වාදී ඇත.

Instead of just following a code of discipline and avoiding negative actions, we can go on to a higher level of practice. A good way of doing this is to observe the positive aspects of the Five Precepts.Then it can be extended up to 8 precepts and also 10 precepts. This will lead to even greater spiritual progress. By practicing harmlessness, compassion, kindness, generocity, faithfulness, responcibility, truthfulness, pleasant speech, self control and mindfulness, people can reach the goal having spiritual satisfaction as well as material and physical satisfaction in their-lives.

16. ඥාති මිත්‍රාදීන්ට සංග්‍රහ කිරීම
(Naatakaana~n ca sa"ngaho)
Helping relatives and friends

පවුලේ සාමාජිකයින්ට අප විසින් ලෙන්ගතුව සියලු යුතුකම් ඉටුකරනවා මෙන්ම, ඉන් ඔබ්බට ඥාති හිතමිත්‍රාදීන්ගේ අවශ්‍යතා ද සොයාබැලීම කළ යුතුය. ඔවුන්ට විශේෂයෙන්ම වයස්ගත වූ අවස්ථාවලදී උදව් උපකාර කිරීම සහ රෝගාතුර අවස්ථාවන්හිදී පිහිටවීම උතුම් මඞගල කරුණකි.වයස්ගතවූ මවක්, පියෙක් යනු ඕනෑම අයෙකුට සිතැඟි පරිදි පින් රැස්කරගත හැකි කදිම තෝතැන්නකි. ඔහු හෝ ඇය ස්වකීය මව හෝ පියා වීම අනිවාර්ය නොවන අතර ඥාති මිත්‍රයෙක් හෝ එසේද නොවන්නෙක් විය හැක. මෙවන් අවස්ථාවක් උදාවීම පෙර පිනක් සේ දකින්නන් එමගින් සිය භෞතික සහ අධ්‍යාත්මික සුවය වඩා වර්ධනය කරගනී. එමගින් ලැබෙන මානසික සුවය තම ගත සිතද සුවපත් කරවනු ලබයි. මෙය **16** වන මංගල කරුණ ලෙස පෙන්වාදී ඇත.

Beyond providing for our immediate family, we should also help for our relatives and friends when they are in need. Specially when they are sick and become into their dotage we should extend our hands for their benefit not only financially but physically and morally. As we provide assistance like this we create goodwill among the people around us. As a result of that it further supports us for our secular progress as well as spiritual progress.

17. නිරවුල් නිවැරදි කර්මාන්තයන්හි යෙදීම
(Anaakulaa ca kammantaa)
Engaging in blameless right activities.

නිරවුල් කර්මාන්ත යන්වෙන් අදහස් කෙරෙනුයේ තමා විසින් සමාජයේ අන් අයගේ යහපත පිණිස කරනු ලබන සේවාවන්ය. ගොඩනැගිලි ඉදිකිරීම, පාසල් ආරෝග්‍යශාලා , නිවාස , මංමාවත් ආදිය ඉදිකිරීම වැනි කටයුතු ද එමෙන්ම ගස් වැවීම, විවිධ වගා කටයුතු වැනි කෘෂිකාර්මික කටයුතු මගින් පරිසරය සුරැකීම ද මෙයට අදාළය. ආර්ථිකව හෝ කායිකව අයහපත් පසුබිමක සිටින සිසු දරුවන් ගේ ශුභසිද්ධිය වෙනුවෙන් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමද, විවිධ ව්‍යාපෘති ඔස්සේ අසරණ වූ වැඩිහිටියන් වෙනුවෙන් සහන සැලසීමද මෙම කර්මාන්තයන්ට අදාළය. **යමෙකු මෙවන් වූ සමාජ සේවයක නිරතව පරිත්‍යාගශීලීත්වය , දයාව, කරුණාව, ප්‍රගුණ කරවමින් ඉමහත් කැපවීමකින් යුතුව අවංක සමාජ සේවයක් ඉටු කරන්නේ නම්**,එය ඔහු කරා පෙරළා ගලා එන ඉමහත් ආශිර්වාදයකි. මෙය, මඞ්ගල **සූත්‍රයේ 17** වන මඞ්ගල **කරුණ** ලෙස දැක්වේ.

An even higher expression of generosity would be to assist the community in general. This can be done by helping to build, or making donations towards the building of schools, hospitals, shelters, roads, etc. which are of benefit to everyone. Even the planting of gardens and trees can improve our environment and the ecology of our planet. Just as important is extending our help to the needy, sick and old. If we have the inclination and the means for any kind of social services, we are indeed **blessed** as we have already developed much generosity and compassion.

18. පාපකර්මයන් ගෙන් වැළකීම*(Aarati paapaa)* To abstain from shunning evil

බුදුදහමේ පෙන්වා දෙන අන්දමට අනර්ථකාරී ක්‍රියාවක් යනු තමාගේ අයහපත පිණිස හෝ අනෙකෙකුගේ අයහපත පිණිස හෝ ඇතැම්විට දෙපාර්ශ්වයේම අයහපත පිණිස හේතුවන කාර්යයකි. මෙලොව පරලොව යහපත අපේක්ෂා කරන්නෝ එවැනි නිෂේධාත්මක කාර්යයන්ගෙන් වැළකිය යුතුය. සතුන් මැරීම, සොරකම් කිරීම, කාමෙහි වරදවා හැසිරීම කයින් සිදුවන වැරදි ලෙසත්, බොරුකීම, කේලාම් කීම, පරුෂ වචන කීම, ඕපාදූප කථාකිරීම වචනයෙන් සිදුවන වැරදි ලෙසත්, දැඩි ලෝභය ව්‍යාපාදය, මිථ්‍යා දෘෂ්ටිය සිතින් සිදු කරගනු ලබන පාප කර්ම ලෙසත්, දස අකුසලයන් ලෙසට බුදු දහමේ පැහැදිලිව පෙන්වා දෙයි. මෙම පාපකාරී කටයුතුවල යෙදීමෙන් වැළකීම තමාගේ මෙන්ම අන් අයගේ යහපත පිණිස හේතුවේ. මෙයද තම කරා එන මහඟු ආශිර්වාදය ක් හෙයින් මඞ්ගල සූත්‍රයේ **18**වන මඞ්ගල **කරුණ** ලෙස පෙන්වා දී ඇත.

Evil in the Buddhist context means any act which harms thy self, others, or both. We should always abstain from all such negative and unhelpful actions. There are 10 unwholesome actions which are clearly categorise into 3 parts.They are bodily actions, verbal actions and mental actions. The evils done by body are **Killing, Stealing and sexual misconduct**. The evils done verbally are **Lying, Slandering, Harsh speech and gossiping.** The evils done mentally are **Covetousness, Ill –Will, and Wrong View** (eg: not accepting Kamma and Re-birth).

19. අයහපත් කටයුතු හෙවත් වරද පිටු දැකීම

(Virati paapaa)

Having no desire for evil

දහ අටවන මඞ්ගල කරුණ ඔස්සේ පෙන්වාදුන් දස අකුසල කර්මයන්ගෙන් වැළකී නිති පංචශීලය ආරක්ෂා කරන්නා කිසියම් මානසික ස්ථාවරයකට පැමිණේ. ඉන් ඔබ්බට හෙතෙම අයහපත්, පාපකාරී කටයුතුවල නොයෙදේ. කිසිවිටෙක ඒ සඳහා කැමැත්තක්ද ඇතිකර නොගනී. සත්‍ය වශයෙන්ම පාපකාරී කටයුතුවල ඇති අහිතකර භාවය අවබෝධ කරගත් ඔහු වරදට පාත්‍ර නොවේ. තමා වරදකට පාත්‍ර වීම යම්සේ ප්‍රතික්ෂේප කරයිද අනෙකෙකු වරදට පාත්‍ර වීම ද වළකාලයි. මෙයින් ලැබෙන ආශීර්වාදය ද ඉතා ප්‍රබල හෙයින් 19 වන මඞ්ගල කරුණ ලෙස මඞ්ගල **සූත්‍රයේ පෙන්වාදෙයි.**

When we have become firm in observing the Five Precepts and abstaining from the Ten Unwholesome Actions, we will find that we no longer have the desire to commit any of these harmful actions. We begin to truly realize that as we ourselves do not wish to be victims of such harmful actions, we should thus avoid doing such actions to others. He himself abstains from evils and makes the others too, to abstain from evils without being a victim of such action. It is **a great blessing** to naturally shy away from doing any harm to others.

20. මත්වතුර සහ මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීම:
(Majjapaanaa ca sa~n~namo)
Refraining from intoxicants.

බුදුරජාණන්වහන්සේ මෙම කරුණ සම්බුදු දහමේ විවිධ ස්ථරයන්හි දී පහදා දී ඇත. මූලිකවම 5 වන ශික්ෂාපදය ලෙස මෙය දක්වා ඇති අතර, එය මත අනෙකුත් ශික්ෂාපද 4 ද, ආරක්ෂා වේ. බීමත් කමට එරෙහි වන මෙම ශික්ෂා පදය තද බල අවවාදයක් ලෙසින් පෙන්වා දී ඇත්තේ මත් වතුර හෝ මත්ද්‍රව්‍ය භාවිතා කරන පුද්ගලයා මනා සිහියෙන් තොරව නොයෙකුත් අයහපත්, පාපකාරී, වැරදි ක්‍රියාවන්ට යොමුවන හෙයිනි. මනා සිහියෙන් පසුවන විටදී වැරදි අනර්ථකාරී ක්‍රියාවනිහි ඇති විනාශකාරී භාවය දකින ඔහු බීමත්කම නිසා වරදට යොමුවී විශාල අගාධයකට ඇදවැටෙයි. ජීවිතය තුළ ගොඩනගා ගත් සියල්ල විනාශවී යයි. මෙයින් වැළකීම, දියුණුවට හේතුවන **20 වන මඬගල කරුණයි.**

The Buddha emphasized this point in many teachings, and as one of the Five Precepts, it is the one that 'protects' the other four Precepts. He strongly advised against taking intoxicants because once we come under their influence, we become capable of committing any harmful acts that we would otherwise not have done. It would be a great waste to have come this far in our personal development only to have it all go to ruin because of drinking or drugs. Avoiding intoxicants is another **great blessing**.

21. සියලු කුසල් දහම්හි පමා නොවීම
(Appamaado ca dhammesu)
To be diligent in wholesome practice

යමෙකු විසින් ස්වකීය අභිවෘධිය වෙනුවෙන් අනුගමනය කළයුතු උතුම් මඞ්ගල කරුණු විස්සක් පිළිබඳව අපි මේ වනවිට දැනුවත්වී ඇත්තෙමු. මීළඟ පියවර වන්නේ එම ආශිර්වාද තවදුරටත් ස්ථාවර ලෙස පවත්වාගැනීම පිණිස භාවිතයට ගෙන වඩ වඩාත් පුරුදු පුහුණු කිරීමයි. එසේ නොමැතිව එපමණකින් තෘප්තිමත්ව එවන් වටිනා ආශිර්වාද පිළිබඳව නොසැලකිලිමත් වන්නේ නම් එය පරිහානියට හේතුවන බවත්, එය මනසිකාර කරමින් බුද්ධිගෝචර ව දෛනික ජීවිතයේදී නැවත නැවතත් ප්‍රගුණ කිරීම මගින් මාහැඟි ඵල ලබා ගතහැකි බවත් මෙයින් පැහැදිලි වේ. මෙසේ අප්‍රමාදීව වර්ධනය කරගතයුතු කුසල ධර්ම 10 කි. දයාන්විතව, පරිත්‍යාගශීලීව, ආත්මදමනයෙන් යුතව කටයුතු කිරීම **කායික වශයෙනුත්**, සත්‍යවූත් කාරුණික වූත් ප්‍රසන්න අර්ථවත් වචන භාවිතය **වාචික වශයෙනුත්**, අනුකම්පාව, මෛත්‍රිය සහ සම්‍යක්දෘෂ්ටිය, **මානසික වශයෙනුත් වඩවා ගතහැකි මාහැඟි කුසල** ධර්මයෝය. මෙම කුසල් අප්‍රමාදීව වඩන්නා උතුම් ආශිර්වාද වඩා වර්ධනය කරගනී. මෙය **21 වන මඞ්ගල කරුණයි** .

We have understood and now follow what is required for our personal development. The next step is to consolidate our practice and not let it deteriorate because of carelesness, or slip away because of complacency. We should continue to be mindful of keeping up and enhanceing our wholesome practices even more. By practicing the 10 Wholesome Actions as follows we can get higher blessings. Copassion-Generosity-and-selfcontrolling can be improved **as bodily actions** . Truthful,Kind,Pleasant and meaningful speech can be improved **as verbal actions**. Sympathy, loving –Kindness and Right –View, can be developed as **mental actions** Then we will find it much easier to get Higher Blessings.

22. ගරු කළ යුත්තන්ට ගරු කිරීම
(Gaaravo)
To have reverence

අපි මූලිකවම බුද්ධ, ධම්ම, සංඝ යන උතුම් ත්‍රිවිධ රත්නයට ගෞරව දක්වන්නෙමු. ඒ ත්‍රිවිධ රත්නයේ පරමෝත්කෘෂ්ට වූ ගුණස්කන්ධය මෙනෙහි කරමිනි. එමගින් ලැබෙන්නාවූ ආශිර්වාද බලය අති මහත්ය. එමෙන්ම අපගේ අඛණ්ඩ අධ්‍යාපනයට සහ අධ්‍යාත්මික සංවර්ධනයට මග පෙන්වන ගුරුවරුන්ද, පූජක උතුමන්ද, වැඩිහිටියන්ද ගෞරවයට පාත්‍ර විය යුත්තෝ වෙති. පසඟ පිහිටුවා වැඳීම මෙන්ම ඔවුන් ඉදිරියේ ගෞරවණීය ලෙස හැසිරීමෙන් සහ ඔවුන් කෙරෙහි සුපරීක්ෂාකාරී ලෙස තම අවධානය යොමු කිරීමෙන්ද ඔවුන්ට ගෞරව දැක්වියහැක. ඊට අමතරව බුදුරජාණන්වහන්සේට වැඳුම් පිදුම් සිදුකරමින් ගෞරව දැක්වීමේදී ලබන්නාවූ ආශිර්වාද තුළින් අපගේ මනස සුවපත්ව ධර්මයට වඩාත් නැඹුරු වීමක් සිදුවෙයි. මෙය දෛනික ජීවිතය තුළ ප්‍රායෝගීකරණය කිරීමේදී අප තුල කෘතඥපූර්වක භාවය සහ නිහතමානී බව වැනි උසස් ගුණාංග වඩවයි. මෙය ස්වකීය ජීවිතයට ආශීර්වාදයක් ම වන හෙයින් 22 වන **මඞ්ගල** කරුණ ලෙසට පෙන්වාදී ඇත.

We can show reverence to the Triple Gem of the Buddha, Dhamma and Sangha by reflecting on their sublime qualities. Having reverence for elders, monks and spiritual teachers allows for our continued learning and guidance. We can show our reverence by respectful behaviour and careful attendance to them. In addition, showing reverence to the Buddha helps to put us in a good state of mind to learn and practice the Dhamma. Practicing reverence also increase our humility and gratitude.

23. යටහත් පහත් බව
(Nivaato)
To be humble

කිසියම් ප්‍රමාණයක දියුණුවකට පත්වූ ඇතැමුන් තමා සියල්ල දන්නා අය ලෙසත් තමාට වඩා උසස් අයෙකු නැති ලෙසටත් සිතීමට පටන්ගනී. මෙම ස්වයං විනිශ්චයට අවතීර්ණ වූවෙකුට විවෘත වූ මනසකින් යුතුව නිවැරදි ආකල්ප දැරීම උගහටය. වෙනත් අයෙකුගේ ගැඹුරු අවබෝධයක් පිළිගැනීමට හෝ යමක් ඉගෙනීමට හෝ ඔහු අපොහොසත්ය. මෙම උඩඟුබව සහ මමත්වය අධ්‍යාත්මික වශයෙන් දියුණුවක් ලැබීමට ප්‍රධානතම බාධකය බවත් පරිහානියට හේතුවන බවත් බුදුරජාණන්වහන්සේ පෙන්වා දී ඇත. එබැවින් නිරතුරුවම නිහතමානී බව ජීවිතය තුළ පවත්වා ගැනීම තමා වෙත ආශිර්වාද ගලා එන කරුණක් හෙයින් මෙය 23 වන **මඞ්ගල** කරුණ ලෙස **මඞ්ගල** සූත්‍රය තුළ ඇතුළත්ය.

Some who have succeeded in making good progress may start to believe that they already know everything and are better than everyone else. If this happens, it becomes difficult to maintain the right attitude and an open mind to learn from others and accept deeper teachings. Here the Buddha reminds us that pride and conceit are two of the biggest obstacles to sustained spiritual development. It is therefore a great blessing to remain humble always. This is the 23rd Blessing.

24. ලද දෙයින් සතුටු වීම
(Santu.t.thi:)
To be content

සමාජගත විවිධ පුද්ගලයන්ගේ ජීවිත විවිධාකාර වූ අවශ්‍යතාවන්ගෙන් පිරි පවතී. ඒවා සංතර්පණය කරගැනීම පිණිස විවිධ කාර්ය භාර යන්හි යෙදෙමින් ලෞකික ජීවිතය වඩා උසස් තත්වයකින් පවත්වාගැනීමට ඔවුන් වෙර දරයි. ඇතැමුන් සතුව විශාල වස්තුවකට ධනයකට හිමිකම් ඇතත් එතුළින් තෘප්තිමත් නොවී තව තවත් එක්රැස් කරයි. තිබෙන්නාවූ ධනය ප්‍රමාණවත් නොවන්නා සේ ඔවුන්ට දැනෙයි. එය පිපාසයට ලුණු වතුර පානය කරන්නාක් මෙන් බව ප්‍රඥාවන්තයා දකී. එම පිපාසය කිසිවිටක නො සංසිඳෙයි. අසීමිත ආශාවන් හඹා යමින් වඩාත් අසතුටට පත්වන ඔවුන් තව තවත් දුක් වේදනාවන්ටම පාත්‍ර වෙයි. ලද දෙයින් තෘප්තිමත් වන්නා සන්සුන් මනසකින් වෙසෙයි. මෙය උසස්ම ධනය ලෙස **24 වන මඞ්ගල කරුණෙහි** දැක්වෙයි.

Different people have different requirements in life and being content does not mean that we should not work hard or strive to improve ourselves. While material things are necessary for survival and comfort, the key is knowing when one has enough. There are many with immense fortunes who are unhappy because they think they still do not have enough wealth. The wise realize that the constant desire to fulfil material cravings is like drinking salt water to satisfy thirst, and this inevitably leads to dissatisfaction, frustration and suffering. To have found our own level of contentment is to have found true peace of mind. Contentment is the greatest wealth.

25. කළගුණ සැලකීම ***(Kata~n~nutaa:)***
To be greatful.

ස්වකීය කාර්ය භාරයෙන් ඔබ්බට අවධානය යොමු කරවමින් අවශ්‍ය අවස්ථාවකදී යමෙකුට පිහිටවීමට හෝ උදව් කිරීමට අද සමාජයේ බහුතරයක් නොවුනද සුළු පිරිසක් හෝ ජීවත්වීම ඉතා වටිනා දෙයකි. අවශ්‍ය අවස්ථාවකදී ලැබුවා වූ පිහිට වෙනුවෙන් අවම වශයෙන් ස්තුති කරන්නවුන් ද නැත්තේ නොවේ. කිසියම් අවස්ථාවක තමාගේ අභිමතාර්ථ සාධනය පිණිස කවරෙකුගේ හෝ උපකාර ලැබුවේ නම් එය සිත් හි දරාගෙන කුමන අයුරින් හෝ ප්‍රත්‍යොපකාර දැක්වීම දෛනික ජීවිතය තුළ පුරුදු පුහුණු කරගත යුතු වටිනා ගුණාංගයකි. එය වදනකින් අගය කිරීම හෝ ක්‍රියාවකින් නැවත උපකාර දැක්වීම හෝ විය හැකියි. එය කලගුණ සැලකීමකි. එමගින් අන්‍යොන්‍ය සුහදතාවය වඩා වර්ධනය කරන හෙයින් එකිනෙකා පිළිබඳ වඩාත් කාරුණික වූ මානසිකත්වයක් ගොඩනැඟෙයි. නිවන් මග ගමන් කිරීමට මෙම මානසික මට්ටම ඉමහත් දායකත්වයක් සපයයි. මෙම ගුණාංගය **25 වන මඞ්ගල කරුණ** ලෙසට **මඞ්ගල** සූත්‍රයේ අන්තර්ගතව ඇත.

It is said that in this world, there are few who will go out of their way to help another. Even fewer still are those who are grateful for the help given to them. Gratitude is usually accompanied by thanks and appreciation, and also by the desire to return any favours done. All this leads to reciprocal kindness and goodwill, and brings even more blessings directly to achieve the goal physically as well as spiritually.

26. සුදුසු කල්හි දහම් ඇසීම
(Kaalena dhammasavana.m:)
To hear the Dhamma at the right time

ධර්මය ශ්‍රවණය සඳහා විශේෂ වූ වේලාවක් හෝ දිනයක් අවශ්‍ය නොවන්නේය. සදහම් පිපාසිත ශ්‍රද්ධාවන්ත අයෙකුට ඕනෑම වෙලාවක තම සවන් ගැටෙන ඕනෑම ධර්ම පර්යායකින් ඵල ලැබිය හැක. අසන ලද ධර්මය සිත්හි ධාරණය කරගෙන තම ජීවිතයට ගලපාගනිමින් ප්‍රඥාවන්තයා දහමෙන් සැනසෙයි. "ධර්මය කොයි වෙලාවේ අහන්න බැරිද"යි කියමින් ධර්මශ්‍රවණය නොසලකා හරින්නන් ධර්මයේ පිහිට පතන්නේ තමාට කරදරයක් පැමිණුන විට පමණි. එපමණකින් විශ්වාසයක් ගොඩනගාගැනීම ප්‍රමාණවත් නොවේ. උපන් සෑම සත්වයෙකුට ම ධර්මය ශ්‍රවණය කිරීමේ භාග්‍යය උදාවී නැත. බුද්ධෝත්පාද කාලයක ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක්: හොඳ උපතක් ලද අපි මෙම ආශිර්වාදයේ නිසි ඵල ලැබීමට සුදුස්සෝ වී ඇත්තෙමු. එබැවින් **මෙම 26 වන මඞ්ගල කරුණ**, ලද පින්වත් උපතින් නිසි ඵල ලැබීමට මහත්වූ භාග්‍යයකි.

Any time is the right time to read or listen to the Dhamma. However, a good time would be when we are troubled, upset or in doubt. This brings calm, assurance and confidence when we need it the most. Not everyone has the opportunity or the means to be able to hear and learn the Dhamma. We should try to always be in touch with it and not let this great blessing go to waste.

27. **ඉවසීම (*Khantii*)**
To have patience

වඩාත්ම වටිනා උතුම් ගුණාංගය **ඉවසීමයි.** එමෙන්ම පුරුදු පුහුණු කිරීමට ඉතාමත් අමාරු ගුණාංගය ද මෙයයි. ලොව සෑම දෙයක්ම වෙනස්වන අතර අප වටා සිටින පුද්ගලයෝද එසේමය. මෙම වෙනස්වීම්වල බහුතරයක් අපේ පාලනයට නතු නොවේ. ඒ සඳහා වෑයම් කරන්නේ නම් අනවශ්‍ය පීඩාවකට අසතුටට මෙන්ම තරහ වෛරය වැනි පුද්ගල සන්තානය තුළ වර්ධනය නොවිය යුතු කෙලෙස් වර්ධනයවීමට එය හේතු වෙයි. **ඉවසීම** අපගේ අධ්‍යාත්මික සංවර්ධනයට එරෙහි වන මෙම ගුණාංග අප තුළ වර්ධනයවීම වළක්වාලයි. මෙය උතුම්ම ගුණාංගය වන්නේ එමගින් ස්වයංපාලනයක් මෙන්ම පුළුල්වූ සැහැල්ලු මනසක් පවත්වාගැනීමටත් ඉන් ඔබ්බට සමාවදීම වැනි උසස් ගුණාංග ළඟා කරගැනීමටත්, අටලෝ දහමට අනුව උදාවන ඕනෑම තත්වයක් හමුවේ සන්සුන් මනසක් පවත්වා ගැනීමටත් මහත් සේ ඉවහල්වන බැවිනි. ජීවිතයට විශාල ආශීර්වාදයක් ගෙන එන මෙම කරුණ **27 වන මඞ්ගල කරුණයි.**

It is said that patience is the highest virtue, and it is certainly one of the most difficult qualities to attain. We will always be subject to changing conditions and the vagaries of the people around us. Most of these things are beyond our control and if we allow ourselves to be overly affected by them, we will suffer unnecessary stress, unhappiness and anger. We also need to be patient with ourselves when we make mistakes or slip back on the spiritual path, and to keep on trying our best. Patience is a great blessing as it leads to forbearance, forgiveness and tolerance. It allows us to be calm and serene, and to maintain a cool head and a clear mind in any situation.

28. අවවාදයට **කීකරුවීම** ***(Sovacassataaː)***
To listen to advice

අවවාදයකට ඇහුම්කම් දීම හෝ අවවාදයක් පිළිගැනීම හෝ සමාජයේ බොහෝ දෙනෙකුට ඉතා අපහසු කාර්යයන්ය. වරදක් පෙන්වා දීමේදී කෝපයට පත්වෙයි. මේ බොහෝවිට මානය නිසා ඇතිවන අනවබෝධය යි. වරද පෙන්වන්නා හතුරන් සේ දකියි. සර්වඥතාඥානය පසක් කරගත් සම්මා **සම්බුදුපියාණන් වහන්සේ හැර අන් සැවොම අසම්පූර්ණ බව නුමුලාව අවබෝධ කටයුතුය. අප අසම්පූර්ණ බවත් අපට අන් අයගෙන් බොහෝ දේ ඉගෙනීමට ඇති බවත් විවෘතව පිළිගැනීමට තරම් නිහතමානී බවක් ඇතිකර ගැනීම ස්වකීය අභිවෘධිය ට ඉමහත් ආශිර්වාදයකි.** එසේ නොමැතිව ස්වකීය මතය ඔස්සේ උඩඟුව ඒකමතික තීරණ ඔස්සේ කටයුතු කරන්නා සැබෑ දියුණුවක් නොලබයි. එබැවින් නිහතමානී ගුණයෙන් යුතුව ස්තුති පූර්වකව අවවාදයට නිසි අවධානය යොමුකර වටිනා අවවාද පිළිගැනීම අභිවෘධයට හේතු වෙයි. **මෙය 28 වන මඞ්ගල කරුණයි.**

Many people find it very difficult to listen to advice, much less accept criticism or have their faults and mistakes pointed out to them. However, we cannot acquire deeper knowledge and make true progress if pride and stubbornness stand in our way. Openness, acceptance and humility when corrected are necessary because we are not perfect and always have more to learn from others. When someone points out or correct our mistskes we have to listen to it carefully and accept it humbly paying gratitude.

29. ශ්‍රමණයන් දැකීම

(*Sama.naana~n ca dassana.m:)*

To see moks and spiritual teachers

ආගමික පූජක උතුමන් සහ ශ්‍රමණයන් වහන්සේලා මුණගැසී කතාබහ කිරීමෙන් අප නොදන්නා බොහෝ වූ ආගමික සහ අධ්‍යාත්මික කරුණු පිළිබඳ දැනුවත්වීමේ භාග්‍යය අප කරා උදාවෙයි. පවත්නා ලෝකයේ ඇති භෞතික හා ශාරීරික මෙන්ම පසිඳුරන්ට හසුවන ද්‍රව්‍යමය වස්තූන්ට ඔබ්බෙන් අත්දැකිය යුතු යමක් ඇති බව අපට සිහිපත් කරවයි. එම අධ්‍යාත්මික මාවත ඔස්සේ යහපත් ඵල ලබමින් ගමන් කරන සැදැහැවත් ප්‍රඥාවන්ත පිරිස් වත්මන් සමාජයේ ද දුර්ලභ නොවන බවද එවන්වූ අය සමඟ එක්ව කටයුතු කිරීමෙන් **මෛත්‍රී, කරුණා, මුදිතා උපේක්ෂා** යන සතර බ්‍රහ්ම විහරණ වඩා වර්ධනය කරගතහැකි බවද පෙන්වාදෙයි. දිව්‍යමය විමානයක් බඳු මෙම ශ්‍රේෂ්ඨ ගුණාංග ආශිර්වාදයක්ම වන **හෙයින් ශ්‍රමණයන් දැකීම හෙවත් ඇසුරුකිරීම 29 වන මඞ්ගල කරුණ ලෙස දක්වා ඇත.**

Meeting such people gives us the opportunity to learn from them and to derive encouragement and inspiration from their wisdom and serenity. It also reminds us that there is more to this world than just the sensual and material, and shows us that there are many who are already well on the spiritual path.

Being with such people should motivate us to practice the Four Brahmaviharas, also known as the Four Heavenly Abodes. By cultivating these noble qualities such as Loving-kindness, Compassion, Sympethitic joy and Equanimity our minds will become to a spiritual and heavenly state.

30. සුදුසු කල්හි ධර්ම සාකච්ඡාවෙහි යෙදීම *(Kaalena dhammasaakacchaa:)* To discuss Dhamma at due season

සද්ධර්මය ශ්‍රවණය, එම කරුණු අධ්‍යයනය සහ ඒ පිළිබඳව කථා කරමින් ගැටලු සහිත කරුණු සාකච්ඡාකිරීම ජීවිත සාර්ථකත්වය සඳහා මනා පිටුවහලකි. එසේ කිරීමෙන් අප හා එකම ගමන් මග යන අධ්‍යාත්මික වශයෙන් කිසියම් ඉහළ ස්ථරයක් සිටින මිතුරන් සමග අදහස් හුවමාරු කරගැනීමට අවස්ථාව සැලසෙයි. දහම් ගැටළුවක් මතුවූ විටක අප්‍රමාදීව එය සාකච්ඡා මාර්ගයෙන් නිරාකරණය කරගැනීම කාලීන ධම්ම සාකච්ඡාවයි. එමගින් වඩාත් පුළුල්වූ ධර්මාවබෝධයක් ලබාගැනීමට මග පැදෙයි. බුදුරජාණන්වහන්සේ ගේ ශ්‍රී මුඛයෙන් දේශනා කරනු ලැබූ ඒ උතුම් ශ්‍රී සද්ධර්මයෙන් බිඳක හෝ නිසි අවබෝධයක් ලැබීමත් එය අපගේ දෛනික ජීවිත හා ගලපා ගැනීමට හැකිවීමත් විශාල භාග්‍යයකි. මෙලෙසින් නිරන්තරයෙන්ම ධර්මයටම සමීපවීම ඍජුවම යොමුවන්නේ උතුම්ම සැපය වූ නිර්වාණ සම්පත්තියටම බැවින් මෙම **ආශීර්වාදය 30 වන මංගල කරුණ** ලෙසට දක්වා ඇත.

To further support the blessing of hearing and learning the Dhamma is to discuss and talk about it. By doing so, we have the blessing of associating with spiritual friends who are on the same path as ourselves. We also have the opportunity to share what we have learned with others and continue to increase our knowledge and understanding of the Buddha's teachings. In this way, we are frequently in touch with the Dhamma and this is the factor that leads directly to the Supreme Blessings. So, Discussing Dhamma at at proper time brings us fortune.

31. **තපස හෙවත් තවුස්දම්හි නියැලීම *(Tapo)***
To practice Energetic self-restraint

මඞ්ගල කරුණු 30 ක් ඔස්සේ අධ්‍යාත්මික දියුණුව කරා පා නගන්නා මේ වන විට උසස් මට්ටමකට ළඟා වී ඇත. ස්වකීය ඉලක්කය කරා ළඟාවීමට කායික හා භෞතික රුචිකත්වයන් සහ සැප පහසු කම් අතහැර වඩාත් වීර්ය කළයුතු අදියරකට දැන් පිවිස ඇත. ගමන් කරන්නාවූ නිවන් මාර්ගයම ඉලක්ක කරගනිමින් පඤ්ච ශීලයෙහි මෙන්ම උපෝසථ අෂ්ඨාංග සීලයෙහිම පිහිටිය යුතු අදියර මෙයයි. මෙම ශික්ෂාපද අට සැදැහැ සිතින් අනුමෝදන් වී බුදු පසේබුදු මහරහතන් වහන්සේලා ස්ව උත්සාහයෙන් අනුගමනය කළ ඒ උතුම් මග ඔස්සේම ඉදිරියටම ගමන් කරමින් ආත්ම සංයමයකින් යුතුව භාවනායෝගීව ගතකිරීමට වැඩිපුර කාලයක් වෙන් කළයුතු අවධිය මෙයයි. මෙසේ ස්වේච්ඡාවෙන් සරල වූ තවුස් දිවිය ගතකිරීම තුලින් කායික හා මානසික සංහිඳියාවක් ඇතිකරවමින් ඍජුවම උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගයටම යොමු කරවයි. මෙම සුවිශේෂී ආශිර්වාදය 31 වන මඞ්ගල කරුණයි.

We have now entered the highest stage where a greater effort is needed for further progress. We should no longer be easily swayed by sensual desires or physical discomforts. We must train ourselves to remain focused on the path. The most basic way is by the strict observance of the Five Precepts, or better still by observing the Eight Precepts. For many practicing Buddhists, it is a tradition to observe the Eight Precepts on new and full moon days, but they can be observed on other days as well.

A good way of training ourselves in self-restraint is to attend meditation retreats where we can practice the Eight Precepts over an extended period of time. This also allows us to lead a simple life of voluntary austerity, providing us the mental and bodily discipline to follow closely to the Eight-Fold Path. Meditation, particularly Vipassana or Insight Meditation, also trains us in the best way of self-restraint, which is constant mindfulness.

32. උතුම් හැසිරීම *(Brahmacariyaa)*

To live according to the Noble Eight-Fold Path

මඞ්ගල කරුණු 31 ක් ඔස්සේ වඩාත් උසස් අධ්‍යාත්මික මට්ටමකට ළඟා වන්නා මෙහිදී ස්වකීය අධ්‍යාත්මික පරිණත භාවය ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සුවිශේෂී ගැඹුරු අවබෝධයකට යොමු කරගනී. ඉහතින් සඳහන්වූ සියලුම මඞ්ගල කරුණු හෙවත් ආශිර්වාද මෙම මාවතට පෙර සූදානමක් පමණි. අධිෂ්ඨානය සහ කැපවීමෙන් යුතුව එතෙක් ආ ගමන් මග මෙම අදියරේදී වඩාත් තීව්‍ර ලෙස නිෂ්ඨාවක් කරා ඍජුවම ඒකරේඛීයව පතිත වෙයි. **සීල, සමාධි, ප්‍රඥා** ලෙස කොටස් 3 කට වර්ගීකරණය කෙරෙන මෙම අරි අටඟ මග ඔස්සේ යහපත් දැක්මකින් යුතුව පරිත්‍යාගය, කරුණාව , දයාව ඔප් නංවමින් ක්‍රමානුකූල ගමන් මගකට පිවිසෙයි. කය වචනය සිත වඩාත් සංවර කරගනිමින් සන්සුන් නිවැරදි දිවි මගක් ඔස්සේ වීර්ය වඩවමින් සිත සමාධිගත වීමත් සමගම චතුරාර්ය සත්‍ය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබයි. මෙම සුවිශේෂී ආශිර්වාදය 32 වන මඞ්ගල කරුණයි.

At this level of spiritual maturity, this blessing does not simply mean a superficial observance of the Eight-Fold Path. At this level, it means a serious and mindful adherence to each and every factor of the Path. All the previous blessings are the preparations for us to follow this path with determination and diligence. The Eight-Fold Path can be summarized into its three aspects of **sila** (morality), **samadhi** (mental development), and **panna** (wisdom). Accordinly with Right **Speech,** Right **Action**, Right **Livelyhood**, Right **Effort**, Right **Mindfullnesss**, Right **Concentration**, Right **Understanding** about **the 4 Noble Truth.** That's the Holy and virtuous life. Reaching up to this state brings immense Blessings.

33. **සිවුසස් දැකීම *(Ariyasaccaana dassana.m)***
Insight into the Noble Truths

ආර්ය අෂ්ටාංගික මාර්ගයේ නිසි ලෙස ගමන් කිරීමෙන් චතුරාර්ය සත්‍ය පිළිබඳ යථාවබෝධයක් ලබයි. මෙය පොත පත තුළින් ලද දැනුම නොවන අතර ස්වකීය ගැඹුරු චින්තනය ඔස්සේ ලැබෙන ප්‍රඥාවර්ධනය ඔස්සේ ලබන අවබෝධඥානයකි. මෙම ප්‍රඥා සම්පත්තිය වඩාත් උසස් මනෝභාවයකට පදනම සකසා දෙයි. සදාචාරාත්මක කුශලාකුශලතාවයන් වඩා වර්ධනය කර ගනී. මෙම ප්‍රයෝගික පුහුණුව මගින් ප්‍රඥාව විනිවිද යන තීක්ෂණ බුද්ධියක් ඇතිවෙයි. මෙම අධ්‍යාත්මික වර්ධනය චක්‍රයක් මෙන් ආවර්තීව ප්‍රඥාවේ වඩාත්ම උසස්වූ නිර්වාණ සුවයට හේතුවන උතුම් චතුරාර්ය සත්‍ය අවබෝධයකරා යොමු වෙයි. එම ප්‍රඥාව තුළින් සත්‍ය 4 පිළිබඳව ගැඹුරු අවබෝධයක් ලබයි. මෙම **සිව්සස් දැකීම** ප්‍රඥාවට ම ගෝචර වන හෙයින් ඒ ඔස්සේ නිවැරදි සිහිය පිහිටුවමින් සමාධිගතව සියලු දුක් ඉතිරියක් නැතිවම මුලින් උපුටා දමමින් දුකක්, ජරාවක්, ව්‍යාධියක් නැති අමූර්ත මහා නිර්වාණ සුවයට පැමිණෙයි. **මෙම ආශිර්වාදය 33 වන** මඞ්ගල කරුණයි.

By following the **Eight-Fold Path**, true understanding of the **Four Noble Truths** will arise.This is different from academic knowledge based on studies, or understanding coming from mere thinking. It is the deep and experiential realization of the truths of reality and existence, arising from the careful practice of morality, mental development, and wisdom.

.

Each aspect of the Eight-Fold Path supports the cultivation and development of the other aspects. For example, observing morality is the foundation necessary for mental development, which leads to wisdom. Wisdom enables us to see the benefits of morality, which we will be more attentive in observing. A higher standard of morality allows for a greater level of mental development which results in an even deeper penetration of wisdom. And this cycle of spiritual growth continues as an upward spiral towards true understanding of the Four Noble Truths and the eventual attainment of Nibbana.

34. නිවන් අවබෝධ කරගැනීම
(*Nibbaana sacchikiriyaa)*
Realization of Nibbana

උත්සාහ කරන කවරෙකුට වුවද මෙම නිවන් සම්පත ළඟාකර ගත හැකිය. එක්වරම පූර්ණ අවබෝධ යකට හෝ සම්බෝධියකට ළඟාවීමට නොහැකි වුවද උතුම් නිර්වාණයට පිවිසීම සඳහා වන ක්‍රමානුකූල වූ පියවරකට එළඹිය හැකිය. මේ සඳහා **සෝතාපන්න, සකෘදාගාමී, අනාගාමී, අර්හත් වශයෙන් අදියර 4 කි**. සෝතාපන්න මාර්ගයට පිවිසීමෙන් සක්කාය දිට්ඨි , විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, නිරුද්ධ වෙයි. ආත්ම භව 7කින් ඉතිරි සංයෝජන ධර්ම 7 ද නිරුද්ධකර නිවන් සුව ලබයි. ඒ සඳහා පියවරෙන් පියවර අධිකලෙස වීර්ය වඩයි. මෙම උතුම් සම්බොධියට ළඟාවීම පිණිස **දස සංයෝජන** ධර්මාවබෝධය අවශ්‍යමය. **සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාම රාග , පටිඝ , රූපරාග, අරූප රාග, මාන- උද්ධච්ඡ , විචිකිච්ඡා, අවිජ්ජා .** මේ සියල්ල නැති කිරීමෙන් නැවත උත්පත්තියකට නොපැමිණෙයි. ඒ උතුම් සම්බෝධිය යි.

All of us are capable of attaining Nibbana. We may not get enlightened straight away but it is possible for us to attain a level from which Nibbana is assured. Enlightenment is not necessarily realized suddenly or completely.There are four gradual stages leading to enlightenment which are **Stream-Entering, Once-Returning, Non-Returning and Full Enlightenment**. Anyone who has attained the first three stages can advance to hightest depending on their practice. To attain full enlightenment, **ten fetters or obstructions**, must be overcome.**1.Belief in immortal soul 2. doubts regarding the teachings of the Buddha 3.Attachment to rites & rituals 4.Sensual desires 5. Anger & ill-will 6. Desiring heavenly existence 7. Desiring existence in a indistinct realm 8. Conceit and pride 9. Restless in discontent 10. Ignorance and delusion.**

35. අටලෝ දහමින් සිත කම්පා නොවීම

(Phu.t.thassa lokadhammehi citta.m yassa na kampati)

A mind unshaken by the ups and downs of life.

ලෞකික ලෝකයේ පවතින සියලුම දේ වෙනස් වීමට භාජනය වීම ස්වභාවිකය. මෙම වෙනස්වීම් අපගේ ජීවිත කාලය පුරාම විටෙක සතුට ගෙනදෙන අතර විටෙක දුක කණගාටුව උදාකරවයි. පවත්නා ලෝකයේ ඇති සෑම දෙයක්ම ක්ෂණයක් පාසා වෙනස්වන අතර පැවතීම හා නැතිවීයාම වලක්වාලිය නොහැක. **උත්පාද -ඨිති - භංග** නම්වූ මෙම ධර්මතාවයට අනුව සිදුවන වෙනස්වීම් අපගේ ජීවිතවලට විවිධාකාර වූ කායික මෙන්ම මානසික බලපෑම් ඇතිකරවයි. අපගේ දෛනික ජීවිතය හා සම්බන්ධ කටයුතුවලදී **ලාභ -අලාභ, යස - අයස, ප්‍රශංසා - නින්දා, දුක -සැප** ආදී වූ අටලෝ දහම පොදු ධර්මතාවයක් ලෙස දැකීම බුද්ධි ගෝචරය. ජීවිතය හා සම්බන්ධ කටයුතුවල වර්ධනයක් හෝ පසුබෑමක් ඇතිකරවන මෙම වෙනස්වීම් හමුවේදී ඒ සියල්ල ජීවිත උරුමයන් සේ සලකා අකම්පිතව නිහතමානීව, සමතුලිත මානසිකත්වයක් පවත්වා ගැනීම යහපතටම හේතුවන ආශීර්වාදයක් හෙයින් මෙය **35 වන මඞ්ගල කරුණ** ලෙස දක්වා ඇත.

There will always be changes in our lives, some which cause happiness while others bring sadness. It is the nature of existence that change is always taking place and the changes relating to our lives are always fluctuating between extremes. **Gain and Loss, Honor and Disgrace, Praise and Blame, Pleasure and Grief** are 8 worldly conditions. Whatever it is, it originates, exists changing little by little and ultimately dies. Realizing the ever-changing nature of our existence and practicing equanimity enables one to be unaffected by these worldly conditions.

36. **ශෝක රහිත බව**

(Asoka.m)

To be free from sorrow

ජීවිත කාලය පුරාම ප්‍රිය වස්තූන් හෙවත් අප කැමැත්තෙන් සිටින ආදරය කරන විවිධ දේවල් නිසා **සංවේගය, සන්තාපය. දුක, සහ පීඩාව** හටගනී. එහි වරද වෙනත් අයෙකුට පැවරිය නොහැක. වගකිවයුත්තා තමාම ය. සියල්ල අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණයට යටත් බවත්, ඇතිවන සෑම දෙයක්ම වෙනස් වෙමින් පැවතී නැතිවී යන අස්ථිර දේවල් බවත් සර්වඥතාඥානය තුලින් අවබෝධකරගත් සම්මා සම්බුදු පියාණන්වහන්සේ එයට **හේතුව තෘෂ්ණාව හෙවත් ඇලීම බව** ලොවට පසක්කළ සේක. මෙය සත්‍යයකි. අවබෝධයෙන් යුතුව සෘජුව මෙම සත්‍යයට මුහුණ දීමෙන් දුක්, වේදනා සන්තාපයන් ගෙන් නිදහස් වීමට අවශ්‍ය පසුබිම සකසා ගත හැක. මෙය උතුම් මංගල්‍යයක්ම වන බැවින් මෙම ආශිර්වාදය **36 වන මඞ්ගල කරුණ** ලෙස දක්වා ඇත.

Sorrow, distress, grief and worry are part of our lives and stem from **clinging and attachment** to the things we desire and love. We can’t blame others for these worries. The enlightened realize the truth of impermanence that whatever arises must also one day cease to exist. By facing this universal truth directly and understanding it, one can get blessing to be free from sorrow. This fact also brings the highest blessings. So it is considered as the 36th omen of the fortune.

37. රාගාදී කෙලෙස් දූලි නොමැති බව
(Viraja.m)
To be free from defilements

ලෝභ ද්වේෂ, මෝහ ආදී වූ අකුසල් මුල් නිසා කෙලෙස් හෙවත් ආශ්‍රවයන් උපදී. සියලුම දුක් වේදනාවන්ට සහ අතෘප්තකර මානසිකත්වයකට මෙම කෙලෙස් සෘජුවම හේතුවෙයි .උසස් මානසිකත්වයක් සඳහා වෙර දරන ඇතැම් ශ්‍රද්ධාවන්තයින් මෙම කෙලෙස් ඉපදීමට හේතුවන අකුසල් මුල් අනුශය වශයෙන් යටපත් කරගෙන සිටියි. එහෙත් නිරන්තරයෙන්ම විටින්විට මතුපිටට පැමිණෙයි. එබැවින්, මෙම ක්ලේශයන්ගේ ඉතා සියුම් වූ උත්පාදන ස්වරූපය සම්පූර්ණයෙන්ම මුලින් උපුටා දැමිය යුතුමය. මෙම කෙලෙස්, **ආශාව සහ උපාදානය, අරුචිය සහ නුරුස්නා බව, අකැමැත්ත සහ මෝහාන්ධකාරය** නිසා විටින් විට මතුවෙයි. ආර්ය මාර්ගයේ ගමන් කරන **සෝවාන්, සකෘදාගාමී, අනාගාමී** ආර්යයන් වහන්සේලා **සප්ත බොජ්ඣඞ්ග වඩමින්** මෙම කෙලෙස් ක්‍රමානුකූලව සිඳිමින් අවසානයේදී සියලුම ආශ්‍රවයන් ක්ෂය කර උතුම් අර්හත් ඵලය ලබයි. **මහා මඞ්ගල සූත්‍රයේ 37 වන කරුණ** ලෙසට පෙන්වාදී ඇති මෙම උත්තරීතර තත්වයට පියවරෙන් පියවර ගමන් ගන්නා පුද්ගලයා අර්හත් ඵලය ලබා සසර ගමන අවසන් කරයි.

The defilements of greed, hatred and delusion are the root causes of all suffering and unsatisfactoriness. Even the most subtle aspects of the defilements should be eradicated. These subtle aspects include **desire and clinging, aversion and irritation**, and **disinterest and ignorance**. By practicing **Mindfullness, Investigation, Energy, Joy,Relaxation, Concentration,and Equnimity,** they reach the goal. This evaluation of 7 Enlightment factors is **ONE** of the **'7 Sets'** of **"Enlightment related States"** The enlightened are totally free from all of defilement and approach to Nibbana.

38. බිය රහිත සැනසිලි දායක බව **(*Khema.m)***

To have lasting peace and perfect security

නිතර වෙනස්වීම් වලට භාජනය වන අපගේ සාමාන්‍ය ජීවිත පැවැත්ම තුළ ඇති අතෘප්තිකර ස්වභාවය කෙළවර කොට ස්ථිරසාර වූ නිවන් සැපයට ළඟාවීම මහත්වූ සැනසිල්ලකි. මෙම සැනසීම කිසිවිටක වෙනස් වීමකට භාජනය නොවේ. එය අඩු ලුහුඬු කිසිවක් නැති කේවල සම්පූර්ණ ස්ථිරසාර වූ සැනසීමකි. මෙම අත්‍යන්ත වූ ආශිර්වාදය තුළින් පරිපූර්ණ වූ ස්ථිර සැපත ළඟා කරදෙයි. නැවත නැවතත් භවගාමී වීමේ අවදානම මෙම අදියරේදී පලාගොස් ඇත. බිය රහිතය. සියලු ආරක්ෂාව, සදාකාලික සැපත උරුම වී ඇත. ශ්‍රී සද්ධර්මය පවතින මෙවන් බුද්ධෝත්පාද කාලයක ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් ලබා ජන්ම ලාභය ලැබූ අපි මෙම උත්තරීතර ආශිර්වාදයෙන් උපරිම ඵල නොලබන්නේ නම් එය කෙතරම් අභාග්‍යයක්ද? **මෙම 38 වන මඞ්ගල කරුණ** තුළ ගැබ්ව ඇති උපරිම රසාස්වාදය ලැබීමට පළමුවන මංගල කරුණේ සිට අනු පිළිවෙලින් ජීවිතයට ආශිර්වාද ළඟා කරගත යුතු බව අවබෝධ කටයුතුමය. **ශ්‍රී සද්ධර්මයේ සෑම අංශු මාත්‍රයකම ඇත්තේ ඵලදායී මාර්ගෝපදේශයකි.** උක්ත මංගල කරුණු 37 මත පදනම්ව ඇති මෙම අවසාන ඉලක්කය අපගේ ජීවිත ජයග්‍ර හණයයි.

Unlike the ever-changing and unsatisfactory nature of our mundane existence, the peace and happiness of Nibbana is permanent. Even the slightest taste of Nibbana can never be lost. Thus to have attained Nibbana is to have attained the ultimate blessing of perfect peace and absolute security. That is the goal we all should achieve by striving firmly and regularly.

SUMMARY

THOSE WHO ABIDE BY THE TEACHING ,

OF THE BUDDHA

WILL HAVE ESTABLISHED

COMPLETE SAFETY,

AND ATTAIN

UNENDING HAPPINESS

WHEREVER THEY ARE.

* * *

←11→------- භවයක සැනසුම --------→

මඟක් ඇත පැහැදිලිව නිවනට දොරටු ඇත පිවිසෙන්න පුළුවන්
වළක් වන්නට වෙර දරයි මරු විවිධ බාධක යොදා නිතැතින්
කලක් ගතවිය සසර ගමනේ කොයිබ යන්නේ ඉපිද මැරෙමින්
සකස් කර ඇති කරුණු මඞ්ගල දකිනු මැන දිවි මග තුලින්

දෙසා වදහළ බුද්ධ ධර්මය එල්ල වන්නේ උතුම් නිවනට
අසා බුදුබණ දිවිය එලෙසින් සැකසුවේ නම් උතුම් මඟකට
වසාගෙන ඇති මෝහ අඳුරේ පටල එකිනෙක කඩා සුන් කොට
ගසාගෙන යයි කටුක දුක් වේදනා නැත ඉතිරියක් විඳිනට

ඇරයුමකි මේ පොදුවෙ සැමටම හදේ ගිනිදැල් නිවාලන්නට
නැරඹුමකි මේ විවිධ දර්ශන කරළියෙන් පිට නොමැත දක්නට
සැමරුමකි ලද භවය නිසිලෙස, නොඑන්නේ නම් සසර ගමනට
පැරදුමකි බැරි වුණොත් මේ වර, සසර ගමනට තිත තැබීමට.

කරුණු 38 ඉගෙන ගත්ත ද, වදන් පෙළකින් මහා **මඞ්ගල**
අරුම පුදුමයි ඇතුළාන්තය, දකින විටමය සදා **මඞ්ගල**
වරුණ උපමා කිසිත් නැත බුදු වදන්මය, ගොනු කළේ වදහළ
දරුණු ඇවිලුණ හද නිවාලයි සිසිල් දිය උල්පතකි මතුකළ

බුදුන් දෙසූ දම් සැම විටකම ඉලක්කය වී තිබේ නිවනට
නඳුන් උයනකි සිසිල ගෙන දෙන සුවඳ එක්වන්නේය පවනට
සඳුන් තවරා පුද කළත් මදි, වදාළා වූ දහම් ගුණයට
බවුන් වඩනා විටදි සැනසුම අමා බිඳු වන්නේය හදකට

ජීවිතය වැනි දහම් ගඟුලේ සැරිසරන්නට සැමට සවිබල
නීතිමය අණ පනත් මෙහි නැත ළඟාකරගත යුතුය **මඞ්ගල**
සීමිතය මෙම ආයුකාලය, ලබාගන්නට දිවි යෙ නිසි ඵල
භීතියක් නොමැතිවම අවසන් කරමු ජීවය හදින් සවිබල

පුණ්‍යානුමෝදනාව

යහගුණ සහ කුසලතාවන් වඩාත් ඔප් නංවමින්,
සමාජයට මාහැඟි සේවයක් ඉටු කිරීම සඳහා
මංපෙත් විවර කර අපවත්වී වදාළ
පූජනීය දරණාගම කුසලධම්ම හිමිපාණන් ඇතුළු
අති උතුම් සංඝ පීතෘන් වහන්සේලාටත් ...

අපව මෙලොවට බිහිකර අසීමිත සෙනෙහසකින් යුතුව,
බොදු හැඟුම් අප හද තුළ ජනිත කරවමින් හදා වඩා
ගුණ නැණ බෙලෙන් පෝෂණය කළා වූ,

අප දෙපාර්ශ්වයේ දයාබර දෙමාපියන් ඇතුළු ඥාතීන්ටත්...

සාරධර්ම පරිපෝෂණයත් සමගින් නිසි අධ්‍යාපනය ලබාදුන්
ආදරණීය ගුරු දෙමාපියන්ටත් ...

සුනාමි උවදුරෙන් ජීවිත අහිමිවූ
සුමනා චන්ද්‍රලතා ගුරු මෑණියන් ඇතුළු සැමටත් ...

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස ඉතාමත් දූරදර්ශීව,
අභීතව තීරණ ගනිමින්, තිස් වසරක් පුරා පැවති
සාපරාධී ත්‍රස්තවාදී උවදුරෙන්
මෙම ධර්මද්වීපය බේරාගැනීම සඳහා

පුරෝගාමී වූ ශ්‍රේෂ්ඨ ජන නායකයින්ටත් ...
සටන් මෙහෙයුමේදී දිවි පිදූ වීරෝදාර ත්‍රිවිධ හමුදා නිලධාරීන්
ඇතුළු දේශ ප්‍රේමී සෙබළුන්ටත් ..
සත්පුරුෂ කෘතවේදී ඥාති හිතෛෂී සැමටත් ..

මෙම සදහම් ග්‍රන්ථ සම්පාදනයෙන් ලැබෙන්නා වූ සියලුම පින්
අනුමෝදන් කරමි. අනුමෝදන් වෙත්වා !
සාධු ! සාධු !! සාධු !!!

ආශ්‍රිත ග්‍රන්ථ

- පිරුවානා පොත් වහන්සේ
- ධම්ම පදය
- චතුරාර්යසත්‍යය - රේරුකානේ චන්දවිමල මහා නාහිමි
- බෞද්ධ ඇදහිල්ල - අත්තුඩාවේ ශ්‍රී රාහුල හිමි
- ශබ්දාර්ථ රත්නාකරය - බෝරුගමුවේ ශ්‍රී රේවත හිමි
- බෞද්ධ පර්මාදර්ශයන් - බුද්ධංගල ආනන්ද හිමි
- දිවි මගට දහම් මග - තලගල සුමනරතන නාහිමි
- Wisdom of Silence – Ven Ajhn Brahma Vansmo
- Buddhist Devotion - Ven Bhikkhu Bodhi
- Education for Mindfulness – Ven: Dr Mirisse Dhammika
- Buddhist Devotion- Ven K Sri Dhammanand
- Buddhism: Its Essence & relevant approaches – Raja Kuruppu
- Dhamma Man and Law – Dr K. N. Jayatilleke
- Dictionary of the Pali Language – Robert Ceasar Childers

- මඞ්ගල කරුණු සියල්ල ගාථා 11 ක් තුලින් කෙසේ එළිදැක්වේ ද?
  How do all the blessing reveal through 11 stanzas?
- මඞ්ගල කරුණු කවරෙකුගේ යහපත පිණිස ද ?
  Who get the benefit of these blessings ?
- මෙම මඞ්ගල කරුණු දෛනික ජීවිතය තුළ ප්‍රායෝගිකද ?
  Are these vital points practicable in day to day life?
- සාර්ව දැක්මක් තුලින් ලදහැකි ඵලය කෙතරම් සුන්දරද ?
  How pleasant the profit of the general review?
- ලබන්නාවූ ආශිර්වාද බලය කුමන පරාසයක් තුළ විහිදේ ද ?
  In which scope the power of these blessings spread?

ධර්මානුකූල පිළිතුරු පාලි, සිංහල සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් අන්තර්ගතයි.

Answers according to Dhamma are included in Pali, Sinhala, and English.

මෙම ග්‍රන්ථයෙහි පාලි ගාථාවන්හි ඉංග්‍රීසි සහ සිංහල පරිවර්තනයන්, මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමේ අධ්‍යක්ෂිකා, කොළඹ 7, ඩී.එස්.සේනානායක විද්‍යාලයේ සේවයෙන් විශ්‍රාමලත් ප්‍රවීණ ඉංග්‍රීසි ආචාරිණී කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක මැතිනිය විසිනි.